ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

# காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம்

Land Use Policy Planning Department

# 2018

## කාර්ය සාධන වාර්තාව

## செயற்திறன்அறிக்கை

# Performance Report

පටුන

**1.හැඳින්වීම..........................................................................................................01**

1.1 දැක්ම..........................................................................................................01

1.2 මෙහෙවර..........................................................................................................01

1.3.කාර්යභාරය..........................................................................................................01

1.4.ක්‍රියාකාරකම් ..........................................................................................................02-04

**2.සංවිධාන ව්‍යුහය..........................................................................................................05-06**

**3.මානව සම්පත් කළමනාකරණය**

3.1 කාර්ය මණ්ඩල සංයුතිය..........................................................................................................07

3.2 ස්ථාන මාරු වීම්..........................................................................................................08-09

3.3 ආයතනික තොරතුරු..........................................................................................................10

3.4 මානව සම්පත් සංවර්ධනය..........................................................................................................11-13

**4. මූල්‍ය කළමනාකරණය**

4.1.වැය ඇස්තමේන්තුව -2018..........................................................................................................14

4.2.රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම ..........................................................................................................14

4.3.අදායම් ගිණුම්..........................................................................................................14-15

4.4.භෞතික සම්පත් කළමනාකරණය -2018..........................................................................................................16-17

4.5.ගබඩා සමීක්ෂණ ..........................................................................................................17

4.6.විගණන කටයුතු ..........................................................................................................17

**5.සංවර්ධන කටයුතු**

5.1.ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරිම.......................................................... 18

5.2.ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය ..........................................................................................................18

5.3. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම ..........................................................................................................18-20

5.4. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම ..........................................................................................................20-22

5.5. තිරසර ඉඩම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම්, වැඩමුළු හා සාකච්ඡා පැවැත්වීම .................22-23

5.6. තිරසර භූමි භාවිතය සඳහා ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම......... .............23-25

5.7.සහභාගිත්ව ප්‍රවේශය තුලින් ක්ෂුද්‍ර ජල පෝෂකවල භූමි පරිහරණය සැලසුම් කිරීම ................25-26

5.8.පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව

ඉහළ නැංවීම …...........................................................................................................26-28

5.9.පහතරට තෙත් කලාපීය කුඹුරු ඉඩම් භූමි ශක්‍යතාව අනුව වර්ගීකරණය කිරීම......................28-29

5.10.සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යයන...........29

5.11. හායනයට පත් ඉඩම් හඳුනා ගැනීම, වර්ගීකරණය සහ සිතියම් ගත කිරීම............................29-30

5.12.තෝරාගත් දිස්ත්‍රික්කවල හඳුනාගෙන ඇති නාය අවදානම් ප්‍රදේශ ස්ථාවර කිරීම සඳහා

සුදුසු ඉඩම් පරිහරණයන් නිර්දේශ කිරීම ..........................................................................30

5.13. අංකිත දත්ත සහ සිතියම් වෙනත් ආයතනවලට ලබා දීම .....................................................31-33

5.14. වෙනත් ව්‍යාපෘති ..........................................................................................................34-37

5.15.දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලැබූ වෙනත් රාජකාරී................................................38

5.16. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන්වල සාරාංශ මූල්‍ය ප්‍රගතිය................................39-42

## වගු ලැයිස්තුව


| වගු අංකය | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 1.1 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විවිධ ආයතන සමඟ ඇති සබඳතාවය | 04 |
| 3.1 | කාර්ය මණ්ඩල සංයුතිය | 07 |
| 3.2 | ස්ථාන මාරු පිළිබඳ විස්තර | 08-09 |
| 3.3 | ආයතනික කටයුතු | 10 |
| 3.4.1 | විදේශීය පුහුණු | 11 |
| 3.4.2 | දේශීය පුහුණු | 12 -13 |
| 4.1 | වැය ඇස්තමේන්තුව | 14 |
| 4.2 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 14 |
| 4.3 | ආදායම් ගිණුම | 14-15 |
| 4.4 | භෞතික සම්පත් කළමනාකරණය - නිශ්චල දේපළ | 16-17 |
| 4.5 | චංචල දේපළ | 17 |
| 5.13.1 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලීම් කර ඇති අංකික දත්ත 2017 – 2018 | 32-33 |
| 5.15.1 | දෙපාර්තමේන්තුවේ වෙනත් රාජකාරි කටයුතු | 38 |
| 5.16.1 | දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය -2018 | 39 |
| 5.16.2 | දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන්වල භෞතික ප්‍රගතිය -2018 | 41 |


## ප්‍රස්ථාර සටහන් ලැයිස්තුව


| ප්‍රස්ථාර අංකය | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 5.16.1 | දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය | 40 |
| 5.16.2 | දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල භෞතික ප්‍රගතිය | 42 |

## ඡායාරූප ලැයිස්තුව


| ඡායාරූප අංකය | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 1-2 | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු අවස්ථාවක් | 19 |
| 3-4 | පුත්තලම් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු අවස්ථාවක් | 20 |
| 5-6 | යාපනය දිස්ත්‍රික්කයේ වේලනෙයි , පොයින්ට් පේද්‍රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව පැවති අවස්ථාවක් | 22 |
| 7 | මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව පැවති අවස්ථාවක් | 22 |
| 8 | කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුබෝධා මහ විද්‍යාලය පාසල් සිසුන් දැනුවත් කිරීමේ අවස්ථාවක් | 23 |
| 9 | මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව නිලධාරීන් දැනුවත් කිරීමේ අවස්ථාවක් | 23 |
| 10-11 | රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පරන්ගොඩ මහා විද්‍යාලය පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ අවස්ථාවක් | 23 |
| 12 | යාපනය දිස්ත්‍රික්කයේ පොයින්ට් පේද්‍රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවක් | 24 |
| 13 | ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවක් | 24 |
| 14-15 | රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවන් | 24 |
| 16-17 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවන් | 25 |
| 18-19 | රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවන් | 25 |
| 20 | මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක් | 26 |
| 21 | මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක් | 26 |
| 22 | මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක් | 26 |
| 23 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි | 26 |

| | | |
|---|---|---|
| | විමසුම් වැඩසටහන් අවස්ථාවක් | |
| 24 | සංරක්ෂණය සඳහා තෝරාගත් ඌණ පරිහරණ ඉඩම් කිහිපයක් හා ඒවායේ පස සංරක්ෂණය කරන ආකාරය ගම්පහ දිස්ත්‍රික්කයේ ජා -ඇල ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 27 |
| 25-26 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස හා ජල සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ ගෙවත්ත තුළම ජෛවන්ද්‍රීය පොහොර නිපදවීම | 28 |
| 27-28 | මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය- පාංශු සංරක්ෂණයට පෙර අවස්ථාව | 35 |
| 29-30 | මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පාංශු සංරක්ෂණ ක්‍රම සකස් කිරීමෙන් අනතුරුව | 35 |
| 31 | රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස සංරක්ෂණය ස්ථාපිත කළ ගෙවත්ත වර්තමාන දර්ශණය | 35 |
| 32 | රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස සංරක්ෂණ කටයුතුවල ප්‍රමිතිය පරීක්ෂා කරන අවස්ථාව | 35 |
| 33-34 | කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පස සංරක්ෂණ කටයුතුවල ප්‍රමිතිය පරීක්ෂා කරන අවස්ථාව | 36 |
| 35-36 | බදුල්ල දිස්ත්‍රික්කයේ - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ - පස සංරක්ෂණ කටයුතු අවසන් කළ දර්ශණ | 36 |
| 37-38 | මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ-පස සංරක්ෂණ කටයුතු අවසන් කළ දර්ශණ | 36 |
| 39-40 | මහනුවර දිස්ත්‍රික්කයේ - ගුරුකැලේ රාජමලේ ඇල පෝෂක ප්‍රදේශය - ප්‍රජාව දැනුවත් කිරීම | 37 |
| 41-42 | මහනුවර දිස්ත්‍රික්කයේ-ගුරුකැලේ රාජමලේ ඇළ පෝෂක ප්‍රදේශය-ප්‍රශ්නාවලිය ක්ෂේත්‍රගත කිරීම | 37 |

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 01. හැඳින්වීම

ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස්කර, සම්මත කර ගැනීමේ අවශ්‍යතාවය සහ විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රමවේදයක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව වර්ෂ 1983 දී ඉඩම් හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ අංශයක් ලෙස ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ස්ථාපිත කරන ලදී. ඉන් අනතුරුව සිදු වූ ඉඩම් පරිහරණ සැලසුම් විෂයය හා කාර්යභාරය පුළුල් වීමත්, ඉටුකළ යුතු වගකීම් පුළුල් පරාසයක විහිදීමත් හේතුකොටගෙන වසර 2010 සිට මෙම අංශය දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණි ගත කරන ලදී. මේ වනවිට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 696කි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ ජාතික මට්ටමේ සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබන අතර, එම කටයුතු පහසු කිරීම සඳහා ඉඩම් පරිහරණ සැලසුම්, ශෂ්‍ය විද්‍යා, කෘෂි ආර්ථික විද්‍යා, සමාජ විද්‍යා හා තොරතුරු පද්ධති විෂය යටතේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂවරුන් පත් කර ඇත. පාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන ) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) මගින්ද ගිණුම් කටයුතු ප්‍රධාන ගණකාධිකාරී සහ ගණකාධිකාරී මගින්ද අධීක්ෂණය සිදු වේ.

### 1.1.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම

"ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම."

### 1.2.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශය

පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහායවීම.

### 1.3.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය

2010 අංක 1654/21 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය පරිදි ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු 05 කි.

01.ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.

02.ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.

03.සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදිත් භාවිතා කිරීමට හැකි වනසේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.

04.භූමිය පදනම් කරගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.

05.විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුම පුහුණුව හා අධ්‍යයනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.4.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්

මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

(01). ප්‍රධාන කාර්යයන් වශයෙන් ගැනෙන විශාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

(02). අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

මේ පිළිබඳ විස්තර සැකවින් පහත දැක්වේ.

**<u>විශාල පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මේ යටතට ගැනේ. ඒ අනුව ඉඩම් පරිහරණ සැලසුම්වල ප්‍රායෝගික අවශ්‍යතාව හා ක්‍රියාත්මක කිරීමේ පහසුවත් උදෙසා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

එමෙන්ම උගත් පාඩම් හා සංහිඳියා කොමිෂමේ නිර්දේශ අනුව උතුරු - නැගෙනහිර දිස්ත්‍රික්ක අට (08)සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සිදු කරන ලදී.

**<u>කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

මේ යටතේ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමත්, නාය ආපදා අවම කිරීමත් සඳහා තෝරාගත් ප්‍රදේශවලට සංරක්ෂණ ක්‍රමවේද සැලසුම් කිරීමත්, තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම, හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමත්, රාජ්‍ය ආයතන හා රජයේ පාසැල් පරිශ්‍රයන්වල ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ස්ථාපිත කිරීමත් සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව භාවිතා නොකර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

**ඉහත ප්‍රධාන කාර්යයන්වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා**

01.විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා පාදකවන ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමත්

02.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීමත්.

03.ඉඩම් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, ගොවි ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමත්.

04.ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වා ගෙන යාමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

භූමි සම්පත් කළමනාකරණ විෂයට ගෝලීය පාරිසරික වෙනස්කම් කිහිපයකම බලපෑම් හා සබඳතා පවතී. හරිතාගාර ආවරණය, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, මධ්‍ය මුහුදු මට්ටම ඉහළ යාම, කාන්තාරීකරණය, භූමි හායනය වැනි ගැටළු සම්බන්ධයෙන් බලපවත්නා අන්තර් ජාතික සම්මුතීන් අනුව රජය විසින් අවධාරණය කර ඇති එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ( Sustainable Development Goal) කෙරෙහිද අවධානය යොමුකරමින් දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහාත් භූමි සම්පත තාර්කික ලෙස පරිහරණය කිරීම සඳහාත් මෙම දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සකස් කරනු ලබයි.

ඉහත කාර්ය ඉටු කිරීමේදී මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉඩම් විෂය භාර අමාත්‍යාංශය ප්‍රමුඛ රාජ්‍ය ආයතන ගණනාවක් ඒකාබද්ධව කටයුතු කරනු ලබයි.

ඉඩම් පරිහරණ සැලසුම්කරණ විෂය බහුවිධ විෂය ක්ෂේත්‍රයක් නිසාත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඒකාබද්ධ ප්‍රවේශයක ඇති වැදගත්කම නිසාත් මෙම සම්බන්ධීකරණ කාර්යය දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබේ. එය සටහන 1.1 මඟින් පහත දැක්වේ.

**ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන විවිධ රාජ්‍ය ආයතන.**

**සටහන 1:1**




ඉහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන විවිධ මට්ටම් හා විවිධ අවස්ථාවලදී දෙපාර්තමේන්තුවේ කාර්යන් හා සම්බන්ධ වේ. එසේ නැතහොත් දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීම සිදුකරයි. ඒ මඟින් මෙම දෙපාර්තමේන්තුව සකස් කරනු ලබන සැලසුම් ප්‍රචලිත කර ගැනීමටත්, ක්‍රියාත්මක කර ගැනීමටත් මෙන්ම ඉඩම් සම්පත් කළමනාකරණය සම්බන්ධ නව සැලසුම් සැකසීමට අවස්ථා පුළුල් කර ගැනීමටත් හැකි වී ඇත. වගු අංක 1.1 මඟින් මෙම ආයතන සම්බන්ධතාවය වඩාත් පැහැදිලිව දක්වා ඇත.

**ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විවිධ ආයතන සමඟ ඇති සබඳතාවය**

**වංගු අංක 1:1**


| ආයතනයේ නම | වැඩසටහන් සඳහා සම්බන්ධවන ආකාරය |
|---|---|
| 1. ජනාධිපති ලේකම් කාර්යාලය | 1. පරිසර සංරක්ෂණ වැඩසටහන ( පුනරුදය) |
| 2. ඉඩම් විෂයභාර අමාත්‍යාංශය | 2. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සංශෝධනය හා නෛතික පදනම ස්ථාපිත කිරීම |
| 3. පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | 3. ජාතික මට්ටමේ පරිසර සංරක්ෂණ කමිටු සාමාජිකත්වය හා වැඩසටහන් සාමාජිකත්වය (භූමි හායනය , දේශගුණික වෙනස්වීම්, හරිත ගිණුම්කරණය වැනි) |
| 4. මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 4. මහානගර සැලසුම් ක්‍රියාවලියට අදාළ පාදක තොරතුරු සැපයීම |
| 5. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 5. ඉඩම් පරිහරණ කමිටු වාර්තා ලබා දීම |
| 6. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6. වන ආවරණ 33% ක් දක්වා ඉහළ නැංවීමේ ජාතික වැඩසටහන |
| 7. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 7. දේශගුණික අව බලපෑම අවම කිරීමේ ගංගා ද්‍රෝණි සැලසුම් ව්‍යාපෘතිය |
| 8. පළාත් සභා | 8. ඉඩම් යෝග්‍යතා වාර්තා ලබා දීම |
| 9. දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් | 9. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම |
| 10. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 10. කලාපීයකරණ සැලසුම් කමිටු නියෝජනය හා තොරතුරු සැපයීම |
| 11. නාගරික සංවර්ධන අධිකාරිය | 11. නාගරීකරණ ප්‍රදේශ සඳහා කලාපීයකරණ සැලසුම් සැකසීමේ තොරතුරු ලබාදීම |
| 12. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 12. ප්‍රධාන වැවිලි බෝග ඇතුළත් ප්‍රදේශ සිතියම් ගත කිරීම |
| 13. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 13. පස හා ජල සංරක්ෂණ කටයුතු, තාක්ෂණික පුහුණු සහාය |
| 14. මධ්‍යම පරිසර අධිකාරිය | 14. පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගැනීම හා ප්‍රකාශයට පත් කිරීම |
| 15. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම | 15. ඉඩම් යෝග්‍යතා වාර්තා ඉදිරිපත් කිරීම හා ව්‍යාපෘති යෝජනා ඇගයීම තාක්ෂණික කමිටු නියෝජනය |

## 02. සංවිධාන ව්‍යුහය

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව අනුමත කාර්යමණ්ඩලය 696 කින් සමන්විත (A) ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වේ. ඉඩම් විෂය භාර අමාත්‍යාංශය යටතේ පවතින මෙම ආයතනයේ ප්‍රධාන කාර්යාලය, ආයතන, ගිණුම් හා සංවර්ධන යන අංශවලින් සමන්විත වන අතර, දීප ව්‍යාප්තව දිස්ත්‍රික් කාර්යාල 25ක් සෑම දිස්ත්‍රික්කයකම පිහිටා ඇත. ප්‍රධාන කාර්යාලය මඟින් ලබා දෙන තාක්ෂණික මඟ පෙන්වීම අනුව දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම දිස්ත්‍රික් කාර්යාල 25න් මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත මෙම දෙපාර්තමේන්තු නිලධාරීන් මඟින් සිදුකරනු ලබයි. මෙම සංවිධාන ව්‍යුහය ඇතුළත් සටහන අංක 1.2 සටහන ලෙස දක්වා තිබේ. මේ පිළිබඳ අතිරේක තොරතුරු වගු අංක 3.1 යටතේ දක්වා ඇත.

# සංවිධාන ව්‍යුහය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

සටහන 2:1




■ - දරන්නාට පෞද්ගලික වනසේ

# 03. මානව සම්පත් කළමනාකරණය

## 3.1. කාර්ය මණ්ඩල සංයුතිය

වගු අංක 3:1

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි | 2018 වර්ෂය තුළ සිදු වූ වෙනස් වීම් | | | | | ප්‍රවර්තන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යෑම | ස්ථාන මාරු ගිය | ස්ථාන මාරු පැමිණි | බඳවා ගැනීම් | උසස් වීම් | |
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | - | - | - | - | 01 |
| 2. | අධ්‍යක්ෂ (පාලන ) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 3. | අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 01 | - | - | - | - | - | - | 01 |
| 4. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - | 01 |
| 5. | අභ්‍යන්තර විගණක | 01 | - | - | - | - | - | - | - |
| 6. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. | 04 | 01 | - | - | - | - | - | 01 |
| 7. | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ(ඉඩම් පරිහරණ සැලසුම්) | 01 | 01 | - | - | - | - | 01 | - |
| 8. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 9. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ(සමාජ විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 10. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශෂ්‍ය විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 11. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 01 | 01 | - | - | - | - | | 01 |
| 12. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | 25 | 23 | 02 | - | - | - | - | 21 |
| 13. | පරිගණක පද්ධති විශ්ලේෂක/ වැඩසටහන් සම්පාදක ● | 01 | 01 | - | - | - | - | - | 01 |
| 14. | ගණකාධිකාරී රාජ්‍ය | 01 | 01 | - | - | - | - | - | 01 |
| 15. | කළමනාකරණ සහකාර (අධි පන්තිය ) | 01 | - | - | - | - | - | - | - |
| 16. | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | 294 | 281 | - | 02 | - | - | - | 278 |
| 17. | සංවර්ධන නිලධාරී | 200 | 195 | - | 09 | 01 | 01 | - | #189 |
| 18. | අයවැය සහකාර | 01 | - | - | - | - | - | - | - |
| 19. | තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර | 02 | 02 | - | - | - | - | - | 02 |
| 20. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 50 | 27 | - | ■08 | 01 | ★22 | - | 42 |
| 21 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) | 11 | 11 | - | - | - | - | - | 11 |
| 22. | රියදුරු | 34 | 29 | 01 | 01 | 01 | - | - | 28 |
| 23. | ශිල්පිය සහායක | 25 | 18 | - | - | - | - | - | 18 |
| 24. | කර්යාල කාර්ය සහායක | 37 | 32 | 01 | 04 | 04 | 03 | - | 34 |
| 25. | බංගලා භාරකරු | 01 | - | - | - | - | - | - | - |
| | එකතුව | 697 | 629 | 04 | 24 | 07 | 26 | 01 | 634 |

● - දරන්නාට පෞද්ගලික වන සේ තනතුර අනුමත කර ඇත.

■ - මුදා හැරීම් 02ක්, ඉල්ලා අස්වීම් 02ක් සහ ස්ථාන මාරු වීම් 04ක් ඇතුළත්

★ - රා.පරි. අමාත්‍යාංශය මඟින් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත.

# - ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහනය කිරීම් ඇතුළුව

## 3.2. ස්ථාන මාරු පිළිබඳ විස්තර

වගු අංක 3: 2

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | අනුප්‍රාප්තිකයා ගේ නම | දිනය | රාජකාරී ස්ථානය |
| 1. | එම්.එම්.එම්.කේ.මහීපාල මිය<br>ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | 2018.03.29 | අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | - |
| 2. | එච්.එම්.සී.කුමුදුනී මිය<br>ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | 2018.04.19 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - | - |
| 3. | එච්.පී.ජේ.එල්.එම්. ජයරත්න මිය<br>සංවර්ධන නිලධාරි | 2018.05.10 | ප්‍රාදේශී ලේකම් කාර්යාලය- පුත්තලම | - | - | - |
| 4. | එම්.ශශිකලා මිය<br>සංවර්ධන නිලධාරි | 2018.06.18 | කම්කරු දෙපාර්තමේන්තුව | කේ. දයාලිනී මිය<br>සංවර්ධන නිලධාරි | 2018.10.01 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 5. | ඒ.ජේ.ජේෆීනා මිය<br>සංවර්ධන නිලධාරි | 2018.04.03 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - | - |
| 6. | කේ.එම්.ඒ.ජයවර්ධන මයා<br>සංවර්ධන නිලධාරි | 2018.04.03 | කෘෂිකර්ම අමාත්‍යාංශය | - | - | - |
| 7. | අයි.ආර්.බී.එස්. ආරියපාල මිය<br>සංවර්ධන නිලධාරි | 2018.06.04 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - | - |
| 8. | ආර්.ආර්.ඒ.ජේ. බී මැණිකේ මිය<br>සංවර්ධන නිලධාරි | 2018.08.10 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - | - |
| 9. | එස්.එල්.ඒ.ජීවන්ති මිය<br>සංවර්ධන නිලධාරි | 2018.04.02 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - | - |
| 10. | ඊ.ඩී.එච්.තාරකා මිය<br>සංවර්ධන නිලධාරි | 2018.04.27 | සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව | - | - | - |
| 11. | එස්.ඩබ්.කුරුප්පු මිය<br>සංවර්ධන නිලධාරි | 2018.06.29 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | - | - |
| 12. | එස්.ඒ.සී.සේනානායක මිය.<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.05.31 | සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව | - | - | - |
| 13. | ටී.එම්.බී.තෙන්නකෝන් මයා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.06.11 | රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව | - | - | - |
| 14. | ඩබ්.එම්.බී.යූ.විජේසේකර මෙය<br>රාජ්‍ය තළමනාකරණ සහකාර | 2018.08.14 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | - | - |
| 15. | - | - | - | ඒ.කේ.පී.රංජනී මිය<br>රාජ්‍ය කළමනාකණ සහකාර | 2018.06.11 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 | එම්.එස්.එෆ්.ෆස්නා මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.05.31 | උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | - | - |
| 17 | - | - | - | එන්.එම්.ඩී. නවරත්න මයා රියදුරු | 2018.04.02 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |
| 18. | එන්.ඒ.ටී.එස්. නානායක්කාර මයා රියදුරු | 2018.07.29 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - | - | - |
| 19 | කමල් කුමාර හේරත් මයා කා.කා.ස | 2018.03.02 | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | - | - |
| 20 | ඩී.ආර්.ජී. අමරසිංහ මයා කා.කා.ස | 2018.03.07 | මාතලේ දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය | ඩබ්.ඩී.රම්බණ්ඩා මයා කා.කා.ස | 2018.03.07 | මාතලේ දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය |
| 21 | ඩබ්.දයාරත්න මයා කා.කා.ස | 2018.04.05 | කෑගල්ල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ඩබ්.ජී.අබේසිංහ මයා කා.කා.ස | 2018.04.05 | කෑගල්ල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 22 | වී.කේ.ජී.සී දිලානි මිය කා.කා.ස | 2018.03.02 | ජාතික විගණන කාර්යාලය | බී.පී.එන්.එල්. අප්පුහාමි මයා කා.කා.ස | 2018.03.02 | ජාතික විගණන කාර්යාලය |
| 23 | - | - | - | ආර්.එම්. ධර්මදාස මයා කා.කා.ස | 2018.04.23 | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය ගම්පහ |
| 24 | අයි.ඩී. සුදුසිංහ මෙය රා.ක.ස | 2018.08.30 | ඉල්ලා අස්වීම් | - | - | - |
| 25 | පී.සී.දුනුසිංහ මිය රා.ක.ස. | 2018.08.30 | ඉල්ලා අස්වීම් | - | - | - |
| 26 | ඩී.එම්. එස්.එස්. දිසානායක මෙය රා.ක.ස | 2018.08.30 | හෙද පුහුණු සඳහා මුදාහරින ලදී. | - | - | - |
| 27 | එන්.එච්. බිලාල් මයා රා.ක.ස | 2018.09.20 | හෙද පුහුණු සඳහා මුදාහරින ලදී. | - | - | - |

## 3.3. ආයතනික කටයුතු

වගු අංක 3:3

| අනු අංකය | විස්තර | පෙර වසර (2017) | | | ප්‍රවර්තන වසර (2018) | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | අනුමත කළ සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | සංඛ්‍යාව | අනුමත කළ සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
| 01 | සේවයට බඳවා ගැනීම | - | - | - | 03 | 03 | 0 |
| 02 | විභාග පැවැත්වීම | - | - | - | 02 | 02 | 0 |
| 03 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | 01 | 01 | - | 03 | 03 | 0 |
| 04 | සේවය ස්ථිර කිරීම | 05 | 05 | - | - | 17 | - |
| 05 | උසස් කිරීම | 08 | 08 | - | - | - | - |
| 06 | වැටුප් වර්ධක ගෙවීම | සියළුම | සියළුම | | 634 | 489 | 148 |
| 07 | සේවය දීර්ඝ කිරීම | - | - | - | - | - | - |
| 08 | බඳවා ගැනීම් පටිපාටි සැකසීම | - | - | - | 01 | 0 | 01 |
| 09 | සේවය හැරයාම | 01 | - | 01 | - | - | - |
| 10 | වැඩ තහනම් කිරීම | - | - | - | - | - | - |
| 11 | නැවත සේවයේ පිහිටුවීම | - | - | - | - | | |
| 12 | විනය පරීක්ෂණය | 01 | 01 | - | 01 | - | 01 |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | 07 | 07 | - | 10 | 10 | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව | - | - | - | - | - | - |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | - | - | - |
| 16 | ඇප ආරම්භ කිරීම | - | - | - | - | - | - |
| 17 | ඇප නිදහස් කිරීම | - | - | - | - | - | - |
| 18 | ණය අනුමත කිරීම | - | - | - | - | - | - |
| 19 | දේපළ | 05 | 05 | - | 11 | 11 | - |
| 20 | වාහන | - | - | - | - | - | - |
| 21 | වෙනත් - ආපදා | 90 | 90 | - | 134 | 134 | - |
| 22 | මුදාහැරීම් | 06 | 06 | - | 02 | - | 02 |

## 3.4. මානව සම්පත් සංවර්ධනය

**විදේශීය පුහුණු -2018 වර්ෂය**

වගු අංක 3:4:1

| අනු අංකය | පාඨමාලාව | නිලධාරියාගේ නම | තනතුර | විදේශ පුහුණුව ලැබූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන **(Capacity Building Training Program for Class1 Officers of the Sri Lanka - Administrative service)** | ජී.ඩී.එස්. ගුණවර්ධන මෙනවිය. | අධ්‍යක්‍ෂ (පාලන) | මැලේසියාව | 2018.09.03 සිට 2018.09.09 දක්වා |
| 02 | මැලේසියාව සංවර්ධනය කිරීමේ භූමි පරිපාලනයෙහි භූමිකාවන් හා දායකත්වය **(Roles and Contributions of land Administration in Malaysia Development)** | ජී. එච්.එන්. තිලකරත්න මිය | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප) | මැලේසියාව | 2018.08.26 සිට 2018.09.08 දක්වා |
| 03 | පාරිසරික භූගෝල විද්‍යාව **(Environmental Genomics)** | ආර්. කේ. ප්‍රියමාලි අප්සරා මිය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඉන්දියාව | 2018.08.27 සිට 2018.09.08 දක්වා |
| 04 | භූ විද්‍යාව පිළිබඳ කෙටි පාඨමාලා **(Short Course On Geo informatics)** | එච්.ජී. කීර්තිරත්න මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඉන්දියාව | 2018.09.17 සිට 2018.11.09 දක්වා |
| 05 | කාර්මික කලාප ව්‍යාපෘතිය සඳහා වියදම් කිරීම **(Exposure tour on Industrial Zone Project)** | ආර්. වික්‍රමරත්න මිය. | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප) | චීනය | 2018.12.10 සිට 2018.12.14 දක්වා |

**<u>දේශීය පුහුණු</u>**

වගු අංක 3:4:2

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම සහ විධිමත් රාජකාරී ලිපි සැකසීමේ ක්‍රමවේදයන් හා සාමාන්‍ය පරිපාලනය | 479 (වැඩ සටහන් 08) | ස.අ. (දි.ඉ.ප) /ඉ.ප.සැ.නි., ස/නි.,රා.කළ.ස.නි | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 02 | ආයතන සංග්‍රහ හා මුදල් රෙගුලාසි භාවිතය සම්බන්ධ මූලික දැනුම හා අවබෝධය | 61 | ඉ.ප.සැ.නි., සං.නි.,රා.කළ.ස.නි කළ.ස.නි.(තාක්ෂණ නොවන) | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 03 | පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම හා ලිපිගොනුකරණය | 50 | ඉ.ප.සැ.නි., සං.නි.,රා.කළ.ස.නි කළ.ස. නි(තාක්ෂ.නොවන) | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 04 | වැටුප් පරිවර්තන කිරීම, (අදියර 1 සහ 11) | 50 | රා.ක.ස.නි හා ක.ස.නි (තා.නො) | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 05 | වාහන නඩත්තුව, අනතුරු වලක්වා ගැනීම්, ධාවන සටහන් නඩත්තුව සම්බන්ධ මූලික දැනුම හා වගකීම | 34 | රියදුරු මහතුන් සඳහා | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 06 | මානසික ආතතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 100 | සියළුම නිලධාරීන් | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 07 | භාෂා හැකියාවන් වැඩිදියුණු කිරීම (සිංහල/දෙමළ) | 50 | සියළුම නිලධාරීන් | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 08 | කාර්යාලයෙන් බැහැර ක්ෂේත්‍ර පුහුණු (Outbound Training) | 70 | ප්‍රධාන කාර්යාල නිලධාරීන් | විලේජ් එන්ඩ් ආයතනය | දින 01 |
| 09 | මානසික ආතතිය අවම කිරීම සඳහා වන සුභාවිත සංගීතමය වැඩසටහන | 80 | ප්‍රධාන කාර්යාල නිලධාරීන් | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 10 | කාර්යාලයෙන් බැහැර ක්ෂේත්‍ර පුහුණු (Outbound Training) | 50 | සියළුම සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප) | දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය | දින02 |
| 11 | දේපල උපකරණ සබැඳිම ස්ථාවර වත්කම් පවත්වාගෙනයාම, නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩ සටහන් | 02 | රා.කළ.සහකාර නිලධාරීන්/සං.නි | නිපුණතා සංවර්ධන අරමුදල | දින 01 |
| 12 | නාගරික භූ දර්ශනය පාරිසරික සැලසුම්කරණය(Urban Landscape Ecological Planning) | 02 | ඉ.ප.සැ.නි | මහනුවර - දි.ඉ.ප. | දින 02 |
| 13 | කළමනාකරණ සහකාර නිළධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය(ICT for Management Assistant) | 01 | රා.ක.ස.නි | මිලෝදා ආයතනය | දින 02 |
| 14 | රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණයේ සාරය (Essence of Public Procurement Management) | 01 | සංවර්ධන නිලධාරීන් | මිලෝදා ආයතනය | දින 03 |
| 15 | රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු (Internal Auditing Practices in Public Sector) | 02 | රා.ක.ස.නි. | මිලෝදා ආයතනය | දින 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | ගබඩා සහ ඉන්වෙන්ටරි කළමනාකරණය (Stores and Inventory Management) | 01 | රා.ක.ස.නි/සං.නි | මිලෝදා ආයතනය | දින 02 |
| 17 | ස්ථාවර වත්කම් නඩත්තුව | 01 | රා.ක.ස.නි | නිපුණතා සංවර්ධන අරමුදල | දින 01 |
| 18 | කාර්යාභිවර්ධන පුහුණුව | 02 | රා.ක.ස.නි. | නිපුණතා සංවර්ධන අරමුදල | දින 02 |
| 19 | පරිගණකගත රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය (Computerized Government Payroll System) | 02 | රා.ක.ස. නි | මිලෝදා ආයතනය | දින 03 |
| 20 | සිද්ධි කළමනාකරණය(Event Management) | 02 | තො.තා.නි./ කළ.සහ.නි. | නිපුණතා සංවර්ධන අරමුදල | දින 02 |
| 21 | නායකත්ව කළමනාකරණය(Leadership Management) | 01 | මාණ්ඩලික නිලධාරින් | නිපුණතා සංවර්ධන අරමුදල | දින 02 |
| 22 | ව්‍යාපෘති යෝජනා සැකසීම (Project Proposal Preparation) | 24 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප) | SLIDA | දින 04 |
| 23 | තුලනාත්මක පාලන සටහන් | 03 | රා.ක.ස.නි/සං.නි | ජාතික වගකීම් ලේකම් කාර්යාලය | දින 01 |
| 24 | (Advanced B Accounts) | 02 | රා.ක.ස.නි | නිපුණතා සංවර්ධන අරමුදල | දින 01 |
| 25 | Advanced MS Excel | 02 | රා.ක.ස.නි | මිලෝදා ආයතනය | දින 02 |
| 26 | Public Procurement | 02 | රා.ක.ස.නි | නිපුණතා සංවර්ධන අරමුදල | දින 02 |
| 27 | ක්ෂේත්‍ර පුහුණු කටයුතු (සහභාගීත්ව ගැමි ප්‍රවේශය, ඉඩම් පරිහරණ සැලසුම්කරණය,පාංශු නියැදි පරික්ෂාව ආදිය) | 400 | ඉ.ප.සැ.නි, සංනි | - | වසරක් තුළ නියමිත දිනයන් |
| 28 | ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | - |
| 29 | කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | - |
| 30 | Short Course on "Geo Information for Earth System Science" | 55 | ඉ.ප.සැ.නි , ශිල්පීය සහායක, සංවර්ධන නිලධාරී | ආතර් සී ක්ලාක් ආයතනය | දින 08 |

# 04. මූල්‍ය කළමනාකරණය- 2018

## 4.1. වැය ඇස්තමේන්තු

**වගු අංක 4:1**

| | පෙර වර්ෂය (2017) | | | වියදමේ ප්‍රතිශතය (%) | ප්‍රවර්තන වර්ෂය (2018) | | | වියදමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | |
| ව්‍යාපෘති 2 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 303,870,000 | 301,965,592 | 1,904,408 | 99.37 | 329,616,000 | 307,096,950 | 22,519,050 | 93.17 |
| වෙනත් පුනරාවර්තන | 47,100,000 | 44,552,893 | 2,547,107 | 94.59 | 46,186,000 | 45,621,976 | 564,024 | 98.78 |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | 8,000,000 | 7,562,197 | 437,803 | 94.53 | 5,000,000 | 3,786,855 | 1,213,145 | 75.74 |
| 2002 | 2,000,000 | 649,773 | 1,350,227 | 32.49 | 2,000,000 | 1,015,819 | 984,181 | 50.79 |
| 2003 | 4,000,000 | 3,643,074 | 356,926 | 91.08 | 4,000,000 | 3,811,085 | 188,915 | 95.28 |
| 2102 | 2,500,000 | 2,361,244 | 138,756 | 94.45 | 2,500,000 | 1,255,513 | 1,244,487 | 50.22 |
| 2103 | 2,050,000 | 2,049,799 | 201 | 99.99 | 2,000,000 | 1,251,810 | 748,190 | 62.59 |
| 2104 | 12,000,000 | 10,450,295 | 1,549,705 | 87.09 | 1,500,000 | 1,499,015 | 985 | 99.93 |
| 2401 | 3,000,000 | 2,847,587 | 152,414 | 94.92 | 3,000,000 | 2,949,191 | 50,809 | 98.31 |
| 2507 | 20,000,000 | 19,472,549 | 527,451 | 97.36 | 5,000,000 | 4,740,308 | 259,692 | 94.81 |
| 2509 | - | - | - | 0.00 | 20,000,000 | 19,358,854 | 641,146 | 96.79 |
| **එකතුව** | **404,520,000** | **395,555,002** | **8,964,998** | - | **420,802,000** | **392,387,376** | **28,414,624** | - |

## 4.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

**වගු අංක 4:2**

| සීමාවන් | පෙර වර්ෂය (2017) | | ප්‍රවර්තන වර්ෂය (2018) | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| වියදමේ උපරිම සීමාව | 22,000,000.00 | 21,858,175.94 | 23,000,000.00 | 22,174,753.94 |
| අවම බැර සීමාව | 14,500,000.00 | 17,995,716.20 | 15,500,000.00 | 17,301,038.80 |
| උපරිම හර ශේෂ සීමාව | 69,000,000.00 | 62,810,781.22 | 71,000,000.00 | 65,935,616.10 |

## 4.3 ආදායම් ගිණුම 20-02-02-99

**වගු අංක 4:3**

| | පෙර වර්ෂය (2017) | ප්‍රවර්තන වර්ෂය (2018) |
|---|---|---|
| ඇස්තමේන්තුව | 2,400,000.00 | 2,400,000.00 |
| වර්ෂයේ අදායම | 2,523,976.67 | 2,492,327.97 |
| වෙනස (+/-) | 123,976.67 | 92,327.97 |

## 20-03-99-00

| | පෙර වර්ෂය (2017) | ප්‍රවර්තන වර්ෂය (2018) |
|---|---|---|
| ඇස්තමේන්තුව | 400,000.00 | 400,000.00 |
| වර්ෂයේ අදායම | 528,726.04 | 686,788.99 |
| වෙනස (+/-) | 128,726.04 | 286,788.99 |

\

## 20-02-01-01

| | පෙර වර්ෂය (2017) | ප්‍රවර්තන වර්ෂය (2018) |
|---|---|---|
| ඇස්තමේන්තුව | 55,000.00 | 106,000.00 |
| වර්ෂයේ අදායම | 108,652.55 | 284,611.62 |
| වෙනස (+/-) | 53,652.55 | 178,611.62 |

## 4.4. භෞතික සම්පත් කළමනාකරණය - 2018

### නිශ්චල දේපල

**වගු අංක 4:4**

| ජංගම නොවන වත්කම් | (01) 01.01 දිනට ශේෂය | (2) ගනු දෙනු | | | | | | (3) වෙනස්කම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2(1) අත්පත් කර ගැනීම් | | | 2(2) අපහරණයන් | | 2(3) ශුද්ධ අගය | අගය වෙන ස්වීමේ ලාභ/ අලාභ | භෞතික වෙනස්වීම් +/(-) | ශේෂය | 2018.12.31 දිනට ශේෂය |
| | | මිලදී ගැනීම් මගින් | මාරු කිරීම් අනෙකුත් ආයතන වලින් | මාරු කිරීම් කෙරීගෙන යන වැඩවලින් | විකිනීම් මගින් | මාරු කිරීම් මගින් | 2(3)=2(1)-2(2) | 3(1) | (-)/+3(2) | 3(3)=3(1)+/ -3(2) | 4=1+2(3)+3(3) |
| 1ස්ථාවර වත්කම් | | | | | | | | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | | | | | | |
| නිවාස | | | | | | | | | | | |
| නිල නිවාස | | | | | | | | | | | |
| සංචාරක බංගලා | | | | | | | | | | | |
| උප එකතුව | - | - | - | - | - | - | - | - | - | - | - |
| **නිවාස නොවන ගොඩනැගිලි** | | | | | | | | | | | |
| කාර්යාල ගොඩනැගිලි | 55,000,000.00 | | 11,949,310.27 | 31,744,208.66 | | | 43,693,518.93 | | | | 98,693,518.93 |
| **උප එකතුව** | **55,000,000.00** | | **11,949,310.27** | **31,744,208.66** | - | - | **43,693,518.93** | - | - | - | **98,693,518.93** |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 32,726,266.46 | 1,703,739.00 | | | | 32,268,048.18 | (31,564,309.18) | | 43,190,455.99 | | |
| ප්‍රවාහන උපකරණ | 112,900,000.00 | | | | | 112,900,000.00 | (112,900,000.00) | | | | |
| වෙනත් යන්ත්‍ර හා උපකරණ | | | | | | | | | | | |
| කාර්යාලීය උපකරණ | | | | | | | | | | | 21,478,876.27 |
| පරිගණක උපකරණ | | | | | | | | | | | 10,915,811.00 |
| විද්‍යුත් උපකරණ | | | | | | | | | | | 3,532,486.00 |
| විද්‍යාගාර උපකරණ | | | | | | | | | | | 8,425,240.00 |
| **උප එකතුව** | **145,626,266.46** | **1,703,739.00** | - | - | - | **146,168,048.18** | **(144,464,309.18)** | - | **43,190,455.99** | | **44,352,413.27** |
| 4 නැවත නැවත ජනනය නොවන වත්කම් | | | | | | | | | | | |
| ඉඩම් | 80,000,000.00 | | | | | | | | | | 81,308,927.50 |
| නාගරික හෝ ගොඩනගන ලද ඉඩම් | | | 1,308,927.50 | | | | 1,308,927.50 | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෛද්‍ය හා සේවා | | | | | | | | | | | |
| කාර්මික | | | | | | | | | | | |
| ප්‍රවාහන, සන්නිවේදන හා උපාංග | | | | | | | | | | | |
| මිශ්‍ර නාගරික | | | | | | | | | | | |
| උප එකතුව | 80,000,000.00 | - | 1,308,927.50 | - | - | - | 1,308,927.50 | - | - | | 81,308,927.50 |
| එකතුව | 280,626,266.46 | 1,703,739.00 | 13,258,237.77 | 31,744,208.66 | - | 146,168,048.18 | (99,461,862.75) | - | 43,190,455.99 | - | 224,354,859.70 |

**චංචල දේපළ**

**වගු අංක 4:5**

| **අනු අංකය** | **වත්කම් වර්ගය** | **වසර ආරම්භයේ පැවති තත්ත්වය** | **2018 - වර්ෂය තුළ සිදු වන වෙනස් වීම්** | | | | **වසර අවසානයේ පැවති තත්ත්වය** |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිලදී ගැනීම් | වෙන්දේසි කිරීම් | ඉවත් කිරීම් | |
| 01 | බර වාහන | 12 | - | - | 01 | - | 11 |
| 02 | කැබ් රථ | 23 | - | - | | - | 23 |
| 03 | මෝටර් රථ (ජීප් /කාර්) | 04 | - | - | | - | 04 |

## 4.5. ගබඩා සමීක්ෂණ

2018 වර්ෂය සඳහා සියළු භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

## 4.6. විගණන කටයුතු

යොමුකර ඇති සියළු විගණන වාර්තා සඳහා පිළිතුරු සපයා ඇත.

# 05. සංවර්ධන කටයුතු

## 5.1. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම

2007 වර්ෂයේදී සම්මත වූ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය වර්තමාන ආර්ථික සංවර්ධන ප්‍රමුඛත්වයන් හා අනාගත අවශ්‍යතාවයන්ද පිළිබඳ පුළුල්ව සලකා බලා ඒ අනුවත්, එමෙන්ම ප්‍රතිපත්තිමය කරුණු වඩාත් බලාත්මක කිරීම සඳහා වූ ක්‍රියාකාරකම්, උපාය මාර්ග ඇතුළත් වන ලෙස සංශෝධනය කිරීම සඳහා මේවන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. ඊට සමගාමීව දැනට කෙටුම්පතක් වශයෙන් පවතින ජාතික ඉඩම් පරිහරණ පනත සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම අපේක්ෂා කෙරේ.

එය දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන සියළු ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහාත් වැරදි භූමි භාවිතයන් අවම කිරීමටත් මූලික මඟ පෙන්වීම සිදුකරනු ලබයි.

නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති මෙම පනත් කෙටුම්පතේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම අවශ්‍යව ඇති අතර, ඒ සඳහා මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 5.2. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ යාවත්කාලීන කරන ලද ඉඩම් පරිහරණ තොරතුරුවල හිඟය සැලසුම් සකස් කිරීමේදී විශාල අඩුපාඩුවක් බැවින් එම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා 2015 වර්ෂයේදී ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය ආරම්භ කරන ලදී. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණයෙහි ක්ෂේත්‍ර කටයුතු සහ භූගෝල විද්‍යාත්මක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, 1:10,000 ග්‍රිඩ් ෂීට් අතර ඇති දෝෂ ඉවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ග්‍රිඩ් ෂීට් 1836 කින් ශ්‍රී ලංකාව ආවරණ වේ. මෙසේ යාවත්කාලින කරන ලද ඉඩම් පරිහරණ තොරතුරු සහ සිතියම් ඇතුළත් ප්‍රකාශනයක් ඉදිරියේදී එළි දැක්වීමට නියමිතය.

## 5.3. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

විද්‍යාත්මක පදනමක් මත භූමි සම්පත වඩාත් තර්කානුකූලව භාවිතයට සහ, සංරක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීමටත් ඉඩම් පරිහරණ කමිටු බලාත්මක කිරීම සඳහා වර්ෂ 2018 ඔක්තෝම්බර් 19 හා අංක 18/2365/803/039 සහිත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු කාර්යභාරය වඩාත් බලාත්මක කර ඇත.

විවිධ සංවර්ධන කාර්යයන් සඳහා වූ ඉඩම් ඉල්ලීම් (නිවාස, කර්මාන්ත, වානිජ කටයුතු) දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කරනු ලබන අතර, ඒ පිළිබඳ යෝග්‍යතා වාර්තා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේදී සමාලෝචනය කර නිර්දේශ කරනු ලැබේ. මේ මඟින් භූමි සම්පත් වඩාත් ප්‍රඥාගෝචර ලෙස භාවිතා කිරීමට ඉඩ සැලසෙන අතර, ස්වභාවික ආපදාවලට පත්විය හැකි මෙන්ම, විවිධ සීමාකාරී සාධක සහිත ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා යොදා නොගැනීමටත්, අනාගත කෘෂිකාර්මික ඉඩම් මේ සඳහා යොදා නොගැනීමටත් ඉඩ සැලසී ඇත.

එමෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු අවශේෂ කැලෑ ඉඩම් නිදහස් කිරීමත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා නිදහස් කිරීමත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු නිර්දේශ ලබා දෙනු ලැබේ.

කමිටුවට ඉදිරිපත් වන කරුණක් පිළිබඳව තීරණයක් ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යයනයක් කළයුතු යැයි හැඟෙන අවස්ථාවලදී ඒ සඳහා කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත්කලහැකි අතර, අවශ්‍ය පරිදි ඒ ඒ විෂයයන් සඳහා විශේෂඥයන් ද අනුකමිටුවට පත්කළ හැකිය.

මෙම කමිටුවල කාලීන වැදගත්කම අනුව සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ලේකම්වරයා මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර, සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ඇත. මෙම කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු අතර, විශේෂ හා හදිසි රැස්වීම් කැඳවීමට දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට හැකිය.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ දිස්ති්‍රක් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල හරහා මෙහි සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු70ක් පැවැත්වීමට සැලසුම් කළ අතර, එම කමිටු 70 ම පවත්වා ඇත.

**කමිටුවේ කාර්ය භාරය :-**

01. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රයෝජනයට ගත හැකි දැනට හිස්ව පවතින ඉඩම් පිළිබඳ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.
02. ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය තුළ යෝජිත සංවර්ධන වැඩසටහන්වලට අනුව ප්‍රමුඛතාවය දිය යුතු අංශ නිශ්වය කිරීම.
03. නාගරික සහ ග්‍රාමීය අංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
04. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරීම.

ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණුද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

01. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධව ජාතික මට්ටමේ කමිටුවට පූර්ව දැනුම් දීමට අදාළ කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය වැඩිදියුණු කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය සඳහා මග පෙන්වීම.
03. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා අවශ්‍යවන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
04. දිස්ත්‍රික්කය සඳහා සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ භූමි පරිහරණය සම්බන්ධ පසු විපරම් කටයුතු කිරීම.
05. දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.
06. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මේ නිර්දේශ, සාකච්ඡා කර අනුමත කිරීම.

**2018 වර්ෂයේ පවත්වනු ලැබූ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු අවස්ථාවන්**

**ඡායාරූප අංක 01**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් අවස්ථාවක්



**ඡායාරූප අංක 02**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් අවස්ථාවක්



ඡායාරූප අංක 03

පුත්තලම දිස්ත්‍රික්කයේ - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් අවස්ථාවක්



ඡායාරූප අංක 04

පුත්තලම දිස්ත්‍රික්කයේ - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් අවස්ථාවක්



**දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ සංයුතිය:-**

01. දිස්ත්‍රික් ලේකම් (සභාපති )
02. ප්‍රාදේශීය ලේකම්වරු
03. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ලේකම්
04. පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
06. දිසා වන නිලධාරි
07. මිනින්දෝරු අධිකාරී
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්
09. නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ
10. පළාත් පාලන සහකාර කොමසාරිස්
11. සහකාර අධ්‍යක්ෂ, අපනයන බෝග
12. කළමනාකරු, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
14. ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය
15. සහකාර අධ්‍යක්ෂ ,මධ්‍යම පරිසර අධිකාරිය

මීට අමතරව අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පරිදි වෙනත් දෙපාර්තමේන්තු/ආයතන සඳහා සාමාජිකත්වය ලබා දිය හැකිය.

## 5.4. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ උපදෙස් හා මග පෙන්වීම් මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම කමිටුව ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ සම්බන්ධීකරණය මත සිදුවේ. ප්‍රාදේශීය ලේකම්වරයා සභාපතිත්වය දරණ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියා කටයුතු කරනු ඇත.

**කමිටුවේ කාර්යභාරය :-**

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය සම්බන්ධව ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
03. කොට්ඨාශ තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීම, ඒවාට විසඳුම් ලබාදීම සහ අවශ්‍ය අවස්ථා වලදී දිස්ත්‍රික් කමිටුව වෙත වාර්තා කිරීම.
04. ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා මත පදනම් වූ දිගුකාලින හා කෙටිකාලින යෝජනා සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කළයුතු කාර්යයන් ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම. මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කරගත යුතුය.
05. ජාතික/දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවලට ඉඩම් පරිහරණ කාර්යයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
06. ඉඩම් බෙදා දීම හා වෙන් කරදීම, ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව මගින් අවශ්‍ය නිර්දේශ ලබාදීම.
07. රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කමිටුවේ නිර්දේශය මත සිදුවේ.
08. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ඉඩම් පරිහරණ සැලසුම් කමිටු සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
10. විවිධ කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමේදී යෝග්‍යතාවය පදනම් කරගෙන අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
11. ප්‍රාදේශීය මට්ටමෙන් ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.

**කමිටුවේ සංයුතිය :-**

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි (ලේකම්)
03. ඉඩම් නිලධාරි/ජනපද නිලධාරි
04. කෘෂිකර්ම උපදේශක
05. ගොවිජන සංවර්ධන නිලධාරි
06. අඩවි වන නිළධාරි
07. සහකාර මිනින්දෝරු අධිකාරි
08. පොල්/තේ/රබර්/බහු වාර්ෂික බෝග සඳහා වූ ව්‍යාප්ත නිලධාරීන්
09. සත්ව සංවර්ධන උපදේශක
10. පරිසර නිළධාරි
11. වැවිලි සහ වතු වගා අංශයේ අදාළ නියෝජිතයින්
12. ගොවි සංවිධානයේ නියෝජිතයෙක්
13. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතුවලට අදාළ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්

2018 වර්ෂයේ දී ප්‍රාදේශීය කමිටු 260ක් පැවැත්වීමට ඉලක්ක කළ අතර, එම කමිටු 260ම පවත්වා ඇත.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව ඉඩම් පරිහරණ කමිටු (දිස්ත්‍රික් /ප්‍රාදේශීය) 330ක් ඉලක්ක කළ අතර, මෙම කමිටු 330 ම පවත්වා ඇත. මීට අමතරව අතිරේක ප්‍රතිපාදන යටතේ තවත් කමිටු 30ක් පවත්වා ඇත. ඒ අනුව පැවැත්වූ මුළු කමිටු ප්‍රමාණය 360කි. මේ සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 0.74ක් වන අතර, මෙහි මූල්‍ය ප්‍රගතිය 97.53%කි.

## 2018 වර්ෂයේ පවත්වනු ලැබූ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු අවස්ථාවන්

**ඡායාරූප අංක 05**

යාපනය දිස්ත්‍රික්කයේ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව පැවති අවස්ථාවක්



**ඡායාරූප අංක 06**

යාපනය දිස්ත්‍රික්කයේ පොයින්ට් පේද්‍රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව පැවති අවස්ථාවක්



**ඡායාරූප අංක 07**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව පැවති අවස්ථාවක්



## 5.5. තිරසර ඉඩම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම්, වැඩමුළු හා සාකච්ඡා පැවැත්වීම

විද්‍යාත්මක ක්‍රම වේදයක් මත තිරසර ඉඩම් භාවිතා කිරීම පිළිබඳව පාසල් ළමුන් සහ මජනයා දැනුවත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම් ලෙස උසස් පෙළ හදාරන පාසල් ළමුන්, ග්‍රාමීය ප්‍රජාව සහ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ගැනේ. රටේ අනාගත පරපුර වන පාසල් සිසුන්, වැඩිහිටියන් වෙත ඉක්මනින් පණිවුඩ ගෙනයා හැකි මාධ්‍යක් සේ භාවිතා කළ හැකිය. ඔවුන් ප්‍රශස්ත හා තිරසර භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීම වර්තමානයට වටිනාකමක් එක්කරනවා මෙන්ම අනාගත ආයෝජනයක්ද වේ. අ.පො.ස උසස් පෙළ භූගෝල විද්‍යා විෂය මාලාවේ ඉඩම් පරිහරණ සැලසුම් විෂයෙහි කොටස් ඇතුළත්ව ඇති බැවින් සිසුන් මෙම විෂය යටතේ දැනුවත් කිරීම කාලීනව වැදගත් වී ඇත. එමෙන්ම ප්‍රජාව දැනුවත් කිරීම තුළින් ඔවුන් අනුගමනය කරන වැරදි ඉඩම් පරිහරණයන් අවම කිරිමත්, මෙතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් භාවිතයට යොමු කිරීමත්, ඌණ භාවිත ඉඩම් ප්‍රශස්ත භාවිතයට යොමු කිරීමත්, පස වනාන්තර සහ ජලය ආරක්ෂා කිරීම පිළිබඳ ජනතාවගේ ආකල්ප වර්ධනය කිරිමටත් හැකි වේ. භූමියෙහි තිරසර බව ඇති කිරීම මෙම සියලු දැනුවත් කිරීම්වල අරමුණ වේ.

දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ව්‍යාපෘති තුළින්ද මෙම දැනුම ප්‍රායෝගිකව ලබා දෙනු ලබන අතර, 2018 වර්ෂයේදී සෘජු දැනුවත් කිරීමේ වැඩසටහන් 200ක් පැවැත්වීම ඉලක්ක කරන ලදී. එම වැඩසටහන් 200 දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි පවත්වා ඇත.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම මගින් මේ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 0.6 ක් වන අතර 2018.12.31 දිනට මෙහි මූල්‍ය ප්‍රගතිය 100%කි.

**ඡායාරූප අංක 08**

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුබෝධා මහ විද්‍යාලය පාසල් සිසුන් දැනුවත් කිරීමේ අවස්ථාවක්



**ඡායාරූප අංක 09**

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව / නිලධාරීන් දැනුවත් කිරීමේ අවස්ථාවක්



**ඡායාරූප අංක 10**

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරන්ගොඩ මහා විද්‍යාලය පාසල් සිසුන් දැනුවත් කිරීමේ අවස්ථාවක්



**ඡායාරූප අංක 11**

රත්නපුර දිස්ත්‍රික්කයේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව දැනුවත් කිරීමේ අවස්ථාවක්



## 5.6. තිරසාර භූමි භාවිතය සඳහා ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම

ශ්‍රී ලංකාවේ විශාල වාරි යෝජනා ක්‍රම යටතේ බිහිකළ ගම්මාන සහ පුරාණ වැව් ගම්මාන හැරුණු විට අනෙක් බොහොමයක් ගම්මාන විධිමත් සැලසුමකට අනුව ස්ථාපිත කර නැත. යම් ගමක තිබෙන භූමි ප්‍රමාණය එම ගමේ වැඩි වන ජනගහන අවශ්‍යතාවලට නිසි ලෙස යොදා නොගැනීම නිසා විවිධ ගැටළුකාරී තත්වයන් උද්ගත වීම බොහොමයක් ගම්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. භාවිතා කර ඇති කෘෂිකාර්මික භූමිවල නිෂ්පාදන හැකියාව ක්‍රම ක්‍රමයෙන් පහළ යාම, ගමෙහි තිබෙන ජල මූලාශ්‍ර විනාශ වීම, ගම්බද කැලෑ අඩුවීම, ගවයන්ට තණ උලා කෑම සඳහා භූමිය නොමැතිවීම, ඉදිරි නිවාස අවශ්‍යතා සඳහා භූමිය හිඟ වීම, නායයාම්, ගංවතුර, නියඟය වැනි විවිධ ස්වභාවික උපද්‍රව නිරන්තරයෙන් සිදුවීම සහ ඒවායේ වැඩිවීම යනාදී භූමිය හා බැඳුනු ගැටළු ගම හා බැඳී පවතී. මෙවැනි තත්ත්වයක් යටතේ දැනට භූමිය භාවිතා කර ඇති රටාව සහ භූමියෙහි භෞතික තත්වයන් පිළිබඳව අධ්‍යයන කර ගම්වැසියන්ගේ සහ විවිධ පාර්ශවකාර ආයතනවල සහභාගිත්වය ඇතිව තෝරා ගත් ගම්මාන සඳහා භූමි පරිහරණ සැලසුම් සැකසීම කාලීන වශයෙන් ඉතා වැදගත් වේ. එවැනි සැලසුම්වල නිර්දේශ විවිධ පාර්ශවකාර ආයතන තුළින් ක්‍රියාත්මක කිරීමෙන් ගම්මානවල භූමි සම්පත හා බැඳුණු ගැටළු බොහොමයක් අවම කර ගැනීමට හැකියාව ලැබී ඇත.

ඉඩම් පරිහරණ සැලැසුම තුළ ප්‍රධාන වශයෙන් ගමෙහි වර්තමාන ඉඩම් පරිහරණ තත්ත්වය, ඉඩම් පරිහරණය සම්බන්ධ ගැටළු, නිර්දේශ හා යෝජනා ඇතුළත් වේ. එමෙන්ම ගමෙහි ඉඩම් පරිහරණ සැලැස්ම සිතියමකින් විදහා දක්වන අතර, ඉඩම් පරිහරණ සැලැස්ම තුළ පහත සඳහන් ප්‍රදේශ පෙන්වා දෙනු ලැබේ.

- දැනටමත් නීත්‍යානුකූලව ආරක්ෂා කර ඇති හෝ සංරක්ෂණය කර ඇති ප්‍රදේශ
- ආරක්ෂා කිරීමට හෝ සංරක්ෂණය කිරීමට යෝජනා කරනු ලබන ප්‍රදේශ
- වැඩි දියුණු කළ යුතු / පුනරුත්ථාපනය කළ යුතු කෘෂිකාර්මික ප්‍රදේශ
- ඉදිරි සංවර්ධන අවශ්‍යතා සඳහා යොදාගත හැකි ප්‍රදේශ

මෙම වැඩ සටහන මඟින් දිස්ත්‍රික්ක 25 තුළින් තෝරා ගත් ගම්මාන 200ක් සඳහා 2018 වර්ෂය තුළදී සැලසුම් දෙසීයක් සැකසීම අරමුණු කර ඇත. එම සැලසුම් වෙනත් පාර්ශවකාර ආයතන හා එක්ව ක්‍රියාත්මක කිරීම ඉදිරි වර්ෂවලදී සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ තුළින් ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ඉඩම්වල ඵලදායිත්වය ඉහළ නැංවීමත්, ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමත්, අනාගත ග්‍රාමීය ඉඩම් අවශ්‍යතා සඳහා භූමි සම්පත වෙන්කර තැබීමත්, සංවේදී ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමත් යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.


මෙමගින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම දියුණු කිරීමද අරමුණු කරනු ලැබේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව දිස්ත්‍රික්ක 25 හි තෝරාගත් ගම්මාන 200 ක් සඳහා සැලසුම් 200ක් සැකසීමට ඉලක්ක කළ අතර මෙහි භෞතික ප්‍රගතිය 98.72 % ක් වේ.මේ සඳහා රුපියල් මිලියන 4.89ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලැබූ අතර, 2018.12.31 දින වන විට මූල්‍ය ප්‍රගතිය 98.72%කි.

## ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම (සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන්වල විවිධ අවස්ථා )

**ඡායාරූප අංක 12**

යාපනය දිස්ත්‍රික්කයේ පොයින්ට් පේද්‍රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවක් (පොයින්ට් පේද්‍රු )



**ඡායාරූප අංක 13**

ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවක්



**ඡායාරූප අංක 14,15**

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවන්





ඡායාරූප අංක 16,17

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර සහ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩසටහන් අවස්ථාවන්





## 5.7. සහභාගිත්ව ප්‍රවේශය තුළින් ක්ෂුද්‍ර ජල පෝෂකවල භූමි පරිහරණය සැලසුම් කිරීම

භූමි පරිහරණය සැලසුම් කිරීමේදී වඩාත් සුදුසු වන්නේ ජලයේ ස්වභාවික හැසිරීම් රටාව අනුව භූමි ප්‍රදේශ තෝරා ගැනීමය. ඒ සඳහා විශාල මට්ටමෙන් සැලසුම් කිරීමේදී ගංගා ද්‍රෝණිද, කුඩා මට්ටමින් සැලසුම් කිරීමේදී උප ජල ධාරා ප්‍රදේශ හෝ ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ තෝරා ගෙන එම සැලසුම් සැකසීම වඩා සුදුසු වේ. එමෙන්ම මෙවැනි ජලපෝෂක ප්‍රදේශවල භූමිය විවිධ කාර්යයන් සඳහා භාවිතා කර ඇති බැවින් එවැනි සැලසුමක් සැකසීමේදී ප්‍රජාවගේ සහභාගිත්වය ලබා ගැනීම අනිවාර්ය වේ. එබැවින් තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා භූමි භාවිත සැලසුම් සැකසීම වැදගත් වන අතර, ඉඩම් පරිහරණ ගැටළු බහුලව ඇති ක්ෂුද්‍ර ජල පෝෂක මේ සඳහා තෝරා ගැනීම සිදු කෙරේ. මෙහිදී මෙවැනි ක්ෂුද්‍ර ජල පෝෂකයකට ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක් හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් අයත්වීමට ඉඩ ඇත. මෙම වැඩසටහනේ අරමුණු පළමු වැඩසටහනේ අරමුණුවලට වඩා පුළුල් වන අතර, භූගෝලීය වශයෙන් සැලසුම් ප්‍රදේශය පළමු වැඩ සටහනට වඩා විශාල වේ.

ඉඩම් පරිහරණ සැලසුම්කරණයේදී පුළුල් ප්‍රජා සහභාගිත්වයක් ලබා ගැනීම හා ප්‍රජා මූලික සැලසුම් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීම මෙම වැඩසටහන මඟින් අරමුණු කරනු ලැබේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව සැලසුම් 99ක් තෝරාගත් ක්ෂුද්‍ර ජලපෝෂක ප්‍රදේශ 99ක සැකසීම සඳහා ඉලක්ක කළ අතර, මෙහි භෞතික ප්‍රගතිය 98.70%කි.ඒ සඳහා රුපියල් මිලියන 2.77ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලැබීය. ඒ අනුව 2018.12.31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය 99.99%ක් වේ.

### ක්ෂුද්‍ර ජල පෝෂකවල භූමි පරිහරණය සැලසුම් කිරීම

ඡායාරූප අංක 18,19

රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවන්





**ඡායාරූප අංක 20**

මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක්



**ඡායාරූප අංක 21**

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක්



**ඡායාරූප අංක 22**

මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක්



**ඡායාරූප අංක 23**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහභාගිත්ව ගැමි විමසුම් වැඩසටහන් අවස්ථාවක්



## 5.8. පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

දැනට මෙම දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම්වලින් හඳුනාගෙන ඇති ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම් කුමන හෝ ආකාරයකින් වැඩි දියුණු කිරීම ජාතික වශයෙන් ඉතා වැදගත් වේ. මෙවැනි ඌණ පරිහරණයන් සඳහා විවිධ හේතු බලපෑ ඇති අතර, එම හේතුද මෙම සැලසුම් මඟින් හඳුනාගෙන ඇත. මෙවැනි බිම්වල ප්‍රධාන වශයෙන් පාංශු ඛාදනය සහ පසේ තෙතමනය අඩු වීම දක්නට ලැබෙන අතර, එම නිසා බෝග අස්වැන්න ක්‍රමිකව පහළ යාමක් සිදුවේ. එබැවින් මෙවැනි බිම්වල පස සෝදා යාම අවම කිරීමත්, පාංශු තෙතමනය සංරක්ෂණය කිරීමත් තුළින් භූමි හායනය අවම කර ගැනීමට මඟ පෑදෙනු ඇත.

පස සහ ජල සංරක්ෂණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් ගෘහස්ථ ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම මෙමඟින් අපේක්ෂා කරනු ලැබේ.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක ප්‍රදේශවල ඉදිරි අවුරුදුවලදී නිරන්තර පසු විපරමක් කිරීමටත් එම දත්ත ආරම්භයේදී පැවති තත්වය හා සංසන්දනය කර වැඩි දියුණු වීම ප්‍රමාණාත්මකව ගණනය කිරීමටත් සැලසුම් කෙරේ.

2018 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම මඟින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් වැඩසටහනක් බැගින් වැඩසටහන් 100 ක් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 8.69ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලැබ ඇත. ඒ අනුව 2018.12.31 දිනට මෙහි භෞතික ප්‍රගතිය 99.76ක් වන අතර, මූල්‍ය ප්‍රගතියද 99.03%ක් වේ.

**සංරක්ෂණය සඳහා තෝරාගත් ඌණ පරිහරණ ඉඩම් කිහිපයක් හා ඒවායේ පස සංරක්ෂණය කරන ආකාරය**

**ඡායාරූප අංක 24**

**ගම්පහ දිස්ත්‍රික්කයේ ජා -ඇල ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**පාංශු සංරක්ෂණයට පෙර අවස්ථා**




**පාංශු සංරක්ෂණයෙන් පසු අවස්ථාව**

**පාංශු සංරක්ෂණය සිදු කරමින් සිටින අවස්ථාව**

**ඡායාරූප අංක 25,26**

කොම්පෝස්ට් පොහොර සැකසීමේ අවස්ථාවක්

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  පස හා ජල සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ ගෙවත්ත තළම ජෛන්දීය පොහොර නිපදවීම





## 5.9. පහත රට තෙත් කලාපීය කුඹුරු ඉඩම් භූමි ශක්‍යතාවය අනුව වර්ගීකරණය කිරීම

ශ්‍රී ලංකාවේ කුඹුරු බිම් ව්‍යාප්තිය සැලකූ කළ එම බිම්වලින් වැඩි ප්‍රමාණයක් වියළි සහ අතරමැදි කලාපවල පිහිටා ඇත. එයට සාපේක්ෂව පහත රට තෙත් කලාපයේ කුඹුරු බිම් අඩු ප්‍රමාණයක් ඇති අතර, එම කුඹුරු බිම්ද බොහොමයක් කුඩා කැබලි ලෙස පිහිටා ඇත. ඉඩම් කෙරෙහි ඇති අධික ඉල්ලුම නිසා තෙත් කලාපයේ කුඹුරු බිම් වෙනත් පරිහරණයන් සඳහා භාවිතා කිරීම සුළභව දක්නට ලැබේ. විශේෂයෙන් නාගරීකරණය සීඝ්‍රව සිදුවෙන කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල වැනි ප්‍රදේශ ඇතුළත් පහත රට තෙත් කලාපයේ කුඹුරු බිම් වෙනත් පරිහරණයන්ට යොදා ගැනීම වැඩි වශයෙන් දක්නට ලැබේ. තවද කුඹුරු පුරන් වීමද පහත රට තෙත් කලාපයේ ප්‍රධාන ගැටළුවක් බවට පත්ව තිබේ.

මෙලෙස කුඹුරු පුරන් වීමට සහ වෙනත් භාවිතයන්ට යොදා ගැනීමට විවිධ හේතු බලපෑ ඇති බව පෙනේ. මේ සඳහා සමාජ ආර්ථික ගැටළු මෙන්ම කුඹුරු බිම්  ආශ්‍රිත අනෙකුත් සීමාකාරී සාධකද අඩු වැඩි වශයෙන් බලපෑ ඇති බව දක්නට ලැබේ. විශේෂයෙන් භෞතික සීමාකාරී සාධකවල බලපෑම නිසා යම් කෘෂි දේශගුණික කලාපයක පිහිටි කුඹුරු බිම් සියල්ල ඒකාකාරී නොවන අතර, එහි ඵලදායිතාවද වෙනස් වේ. මෙවැනි විවිධ මට්ටම්වල ඇති කුඹුරුවල අස්වැන්න වෙනස් වන අතර, අදාළ අස්වැන්න ලබාගැනීම සඳහා යෙදිය යුතු පිරිවැයද කුඹුරේ ස්වභාවය අනුව වෙනස් වේ. සමහර විට වී වගාව සඳහා ඉතා හොඳ කුඹුරු වෙනත් පරිහරණයන්ට යොදාගැනීම මෙන්ම වී වගාවට එතරම් යෝග්‍ය නොවූ කුඹුරු වැඩි පිරිවැයක් දරමින් වී වගාව සඳහා යොදා ගැනීමට උත්සාහ ගන්නා අවස්ථාද දක්නට ලැබේ. මෙලෙස කුඹුරු බිම් තෝරා බේරා ගැනීමකින් තොරව වගා කිරීමට පෙළඹීමේ ප්‍රධාන හේතුව වනුයේ එම බිම් නිසි ලෙස වර්ගීකරණයකට භාජනය කර නොතිබීමය. කුඹුරු යම් ආකාරයක වර්ගීකරණයකට ලක් කර වී වගාව සඳහා ඉතාමත් යෝග්‍ය කුඹුරු සහ වී වගාව සඳහා එතරම් යෝග්‍ය නොවන කුඹුරු හඳුනාගත හැකි නම් භූමියේ යෝග්‍යතාවය අනුව සුදුසු පරිහරණය තෝරා ගැනීම තුළින් වඩාත් ඉහළ ඵලදායිතාවයක් ලඟා කර ගත හැකි වේ. එමෙන්ම එවැනි වර්ගීකරණයක් ඇත්නම් කුඹුරු වෙනත් පරිහරණයන් සඳහා යොදා ගැනීමට අවසර ලබාදීමේදී එම වර්ගීකරණය, තීරණ ගැනීම සඳහා පහසු මෙවලමක් ලෙස භාවිතා කිරීමට හැකි වනු ඇත. තවද මෙවැනි වර්ගීකරණයක් තුළින් කුඹුරු පුරන් වීමට බලපෑ ඇති සාධක භෞතික සාධකද, සමාජ ආර්ථික සාධකද නැත්නම් එම සාධක දෙවර්ගයමද යන්න පැහැදිලිව හඳුනා ගැනීමට අවස්ථාව උදා වනු ඇත. එමඟින් කුඹුරු නැවත වීවගාවට හෝ වෙනත් යෝග්‍ය පරිහරණයකට යෙදවීම කාර්යක්ෂමව කළ හැකි වනු ඇත.

මෙම ගැටළුව පදනම් කර ගනිමින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය එක්ව කොළඹ දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් සිදුකර කුඹුරු බිම් වර්ගීකරණය සඳහා ක්‍රමවේදයක් සකසන ලදී. එහි සාර්ථකත්වය මත මෙම ක්‍රමවේදය භාවිතා කර කුඹුරු බිම්වල වී වගාවට ඇති ශක්‍යතාවය අනුව පහත රට තෙත් කලාපයේ දිස්ත්‍රික්ක පහක කුඹුරු වර්ගීකරණය සිදු කරන ලදී. මේ තුළින් අදාළ කුඹුරු පන්ති හතරකට බෙදීමටත් එමඟින් වී වගාවට ඉතා යෝග්‍ය කුඹුරු හඳුනා ගැනීමටත්, වෙනත් පරිහරණයන් සඳහා භාවිතා කළ හැකි කුඹුරු පැහැදිලිව වෙන් කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. මෙම තොරතුරු තීරණ ගැනීමේ ආයතන සඳහා ඉතා වැදගත් වන අතර, වී වගාවට වඩාත් යෝග්‍ය කුඹුරු ආරක්ෂා කර ගැනීමට මඟ පෑදෙනු ඇත.2018 වර්ෂය තුළ මෙම වැඩසටහන මාතර, කොළඹ, කළුතර, ගම්පහ සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනු ලැබිය.

2018 වර්ෂයේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම මඟින් රුපියල් මිලියන 0.597 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉහත දිස්ත්‍රික්ක 05 සඳහා වෙන්කරනු ලැබූ අතර, එහි මූල්‍ය ප්‍රගතිය 97.89%ක් සහ භෞතික ප්‍රගතිය 96.8% ක් පමණ වේ.

## 5.10. සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කරගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යයන

ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමේදී ප්‍රධාන ඉඩම් පරිහරණ ගැටළු ලෙස සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ සංරක්ෂණය කර නොතිබීම, භූමිය සඳහා ඉල්ලුමක් තිබියදීත් ඇතැම් ප්‍රදේශ පරිහරණය කර නොතිබීම, ඌණ ලෙස භූමිය පරිහරණය කර තිබීම සහ භූමිය වැරදි ලෙස භාවිතා කිරීම යන තත්ත්වයන් හඳුනාගෙන ඇත. එසේ වුවද සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙවැනි ගැටළු එතරම් ඉස්මතුව නොපෙනෙන අවස්ථා ඇත. උදාහරණ ලෙස සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඉහත සඳහන් කළ ගැටළුවලට වඩා ඉඩම් භුක්තියේ හෝ අයිතියේ ගැටළු නිසා ඉඩම් පරිහරණයේ යම් ගැටලුකාරී තත්වයන් උද්ගත වී තිබීමට පුළුවන. එසේ නැතහොත් ශ්‍රම හිඟය, ලවණතාවය, ජලගැලීම්, පාංශු ඛාදනය වැනි තත්වයන් නිසා ඉඩම් නිසි ලෙස භාවිතා කිරීමේ දුෂ්කරතා ඇති වී තිබීමට පුළුවන. මෙවැනි විවිධාකාර හේතු/ගැටළු නිසා ඉඩම් නිසි ලෙස භාවිතා කිරීමට නොහැකි වීමෙන් ඵලදායිතාවය හීන වීමක් දක්නට ලැබේ. මෙයට අමතරව විවිධ හේතු නිසා භූමිය හා ඒ ආශ්‍රිත පරිසරය මෙන්ම ජල උල්පත්, ජල මාර්ග, ජලාශ හා වැව් විනාශ වීමක් දක්නට පුළුවන. මෙවැනි ගැටළු විවිධාකාර වන අතර ඒ ඒ ප්‍රදේශවලට සුවිශේෂීද වේ. එබැවින් අදාළ ප්‍රදේශය අනුව ගැටළුවල ස්වභාවය වෙනස් වේ. මෙවැනි ගැටළු දිස්ත්‍රික් මට්ටමේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ හෝ ගම් මට්ටමේ පැවතිය හැකිය. උදාහරණ ලෙස දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවිධිමත් මැටි කැපීම නිසා හායනයට පත්ව ඇති මා ඔය පෝෂිත කලාපය පුනරුත්ථාපනය කිරීමේ සැලැස්ම පෙන්වා දිය හැකිය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් අවිධිමත් ඉඩම් පරිහරණයන් විධිමත් කිරීම හා මා ඔය පෝෂිත කලාපය විධිමත් සැලසුමකට අනුව සැකසීම, පවත්නා මැටි නිධියේ ප්‍රමාණය කල්තියා පුරෝකථනය කිරීම, පරිසර සංරක්ෂය හා කර්මාන්ත සංවර්ධනය යන අවශ්‍යතා දෙකම තුලන කර ගැනීම, මා ඔය පෝෂිත කලාපය පුනරුත්ථාපනය කිරීම, බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම හා භූමි හායනය අවම කිරීම යන ප්‍රතිඵල බලාපොරොත්තු වේ.

ඒ අනුව ඉහත පරිදි ප්‍රදේශයේ ඉඩම් පරිහරණයට අදාළව ජනතාවට දැඩිව බලපාන ගැටළුවක් හඳුනාගෙන ඒ පිළිබඳ විශේෂ අධ්‍යයනයක් කර එම ගැටළු අවම කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර, ඉඩම් පරිහරණ ගැටළු විසඳීම තුළින් ඉඩම් භාවිතය විධිමත් වීම හා ඵලදායිතාවය ඉහළ නැංවීම මේ තුළින් බලාපොරොත්තුවේ. මෙම අධ්‍යයනයන් වර්ෂයක් තුළදී නිම කළ යුතු අතර, නිර්දේශ ඇතුළත් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ අදාළ පාර්ශවකාර ආයතන තුළින් ක්‍රියාත්මක කිරීමේ ඉදිරි වැඩපිළිවෙලක් සකසනු ලැබේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව විශේෂ අධ්‍යයන වැඩසටහන් 72ක් සඳහා රුපියල් මිලියන 3.63ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලැබිය. 2018.12.31 වන විට එහි සමස්ථ භෞතික ප්‍රගතිය 96.92%ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 97.89%කි.

## 5.11. හායනයට පත් ඉඩම් හඳුනා ගැනීම, වර්ගීකරණය සහ සිතියම්ගත කිරීම

1994 එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය සහ භූමි හායනය වැළැක්වීමේ සම්මුතියට 1995 දි ශ්‍රී ලංකාව අත්සන් කළ අතර, ඒ අනුව 2002 වර්ෂයේදී භූමි හායනය සහ නියඟයේ බලපෑම අවම කිරීම අරමුණු කර ජාතික ක්‍රියාකාරී සැලැස්මක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මෙහෙයවීම මත සකසන ලදී. 2002 වර්ෂයේ සිට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මෙම විෂයය සම්බන්ධයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අතුරින් ජල මූලාශ්‍ර හඳුනාගැනීම හා ඒ සම්බන්ධ දත්ත පද්ධතියක් ගොඩ නැගීම, ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් අනුමත කර ගැනීම, ගංගා, ඇළ ,දොළ රක්ෂිත ආරක්ෂා කිරීමට නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, හඳුනාගත් ප්‍රදේශවල හායනයට පත් භූමි පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි වැඩසටහන් ප්‍රමුඛස්ථානයක් ගනී. එසේ වුවද, හායනයට පත් බිම් පිළිබඳ සිතියම්ගත තොරතුරු ප්‍රමාණවත්ව නොතිබීම එම බිම් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් සැකසීමට බාධාවක් වේ. එමෙන්ම භූමි හායන මට්ටම පිළිබඳ අදහසක් ලබා ගත හැකි නම් මෙම බිම් පුනරුත්ථාපනය කිරීම සඳහා වන නිර්දේශ ලබා දීම පහසු වේ.

හායනයට පත් භූමි බර තැබීමේ ක්‍රමයක් භාවිතා කර භූමි හායනය අඩුවෙන් සිදුව ඇති ප්‍රදේශ, භූමි හායනය මධ්‍යස්ත වශයෙන් සිදුව ඇති ප්‍රදේශ සහ භූමි හායනය අධිකව සිදුව ඇති ප්‍රදේශ ලෙස වර්ගීකරණයකට ලක් කරනු ලැබේ.

එබැවින් හායනයට පත් කෘෂිකාර්මික භූමි හඳුනා ගැනීම, එම බිම් හායන මට්ටම අනුව වර්ගීකරණය කිරීම සහ ඒවායේ අවකාශීය ව්‍යාප්තිය සිතියම් ගත කිරීම, ඉදිරි ක්‍රියාත්මක වැඩසටහන් සැකසීම සඳහා මෙම ආයතනයට මෙන්ම අනෙකුත් ආයතනවලටද වැදගත් වේ.

හායනයට පත් භූමි හඳුනා ගැනීම හා වර්ගීකරණය තුළින් ඒවා පුනරුත්ථාපනය සඳහා මඟ පෙන්වීම මෙහි අපේක්ෂිත අරමුණ වන අතර, භූමි හායනය අවම කිරීම තුළින් භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම මෙමඟින් සිදුකිරීමට බලාපොරොත්තු වේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව වැඩසටහන් 25ක් සඳහා රුපියල් මිලියන 0.651 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලදී. 2018.12.31 වන විට එහි සමස්ථ මූල්‍ය ප්‍රගතිය 93.08%ක් වන අතර, භෞතික ප්‍රගතිය 98.28% ක් වේ.

## 5.12.තෝරාගත් **දිස්ත්‍රික්කවල හඳුනාගෙන ඇති නාය අවදානම් ප්‍රදේශ ස්ථාවර කිරීම සඳහා සුදුසු ඉඩම් පරිහරණයන් නිර්දේශ කිරීම.**

භූමි සම්පත් කළමනාකරණයේදී ස්වභාවික ආපදාවලින් භූමියට සිදු වන හානිය අවම කර ගැනීම සඳහා වර්තමානයේදී විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. ගෝලීය උණුසුම වැඩිවීමේ ප්‍රවනතාවත් එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂාපතන රටාවේ සිදුවන ශීඝ්‍ර විචල්‍යතාවන් හේතුවෙන් ආසියානු කලාපය තුළ පසු ගිය වසර කිහිපය තුළම දැඩි ලෙස හානිදායක ආපදා සිදු විය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට පසු ගිය වර්ෂ කිහිපයක් තුළදීම පමණක් නායයෑම හේතුවෙන් විශාල පාරිසරික විනාශයක් පමණක් නොව ජන ජීවිතයට ඉමහත් බලපෑමක්ද ,ආර්ථිකයට ඉතා අහිතකර තත්ත්වයක්ද ඇති විය.

මේ හේතුවෙන් සමාජ සුභසාධනය සඳහාත්, දේපළ පුනරුත්ථාපනය සඳහාත් වාර්ෂිකව දැරීමට සිදුවන පිරිවැය ඉහළ ගොස් තිබේ. එබැවින් නායයෑම්වලින් සිදුවන ආපදා අවම කිරීම ජාතික වශයෙන් අවධානය යොමු කළ යුතු සහ පුළුල් අවධානයක් යොමු කළ යුතු සංසිද්ධියක් බවට වර්තමානයේ පත්ව තිබේ.

නායයෑම් ස්වභාවික සංසිද්ධියක් වුවත් ඉන් ඇතිකරනු ලබන ප්‍රතිවිපාක වඩාත් පුළුල් පරාසයක විහිදීමත්,විවිධ මානව කටයුතු (වැරදි භූමි පරිහරණයන්) මෙම තත්ත්වය උත්සන්න වීමටත්, නායයෑම් සිදුවන සංඛ්‍යාතය වැඩි වීමටත් ඉවහල් වී ඇති නිසා මේ සම්බන්ධයෙන් යම් සැලසුම්ගත ක්‍රියා පිළිවෙලක් තිබීම අත්‍යාවශ්‍ය කරුණකි.

මෙම තත්ත්වය පිළිබඳව සලකා බලා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2018 වැඩ සැලැස්ම සඳහා නායයෑම් ආපදා ප්‍රදේශවල එම අවදානම් අවම කිරීම සඳහා ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රමවේද අනුගමනය කිරීමේ ඇති විභවතාවය හඳුනාගැනීමේ ප්‍රයත්නයක් දරන ලදී.

මෙම මූලික උත්සාහයේදී දැනට ඉදිරිපත් වී ඇති කරුණු අනුව හා පර්යේෂණවලින් පෙන්වා දී ඇති පරිදි සහ ඊට අමතරව විශේෂයෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදුකල ක්ෂේත්‍ර මඟින් දක්වා ඇති පරිදි වැරදි භූමි පරිහරණයන් පාලනය කිරීමත් ප්‍රශස්ත භූමි පරිහණ සැලසුම් ක්‍රමවේද අනුගමය කිරීම මඟින් නායයෑම් අවදානම හා එහි ප්‍රතිවිපාකවල බලපෑම් අවමකර ගැනීමේ හැකියාව ඇතිබව හඳුනාගෙන ඇත.

මේ සඳහා දිවයිනේ අධික ලෙස නායයෑම් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක 07ක ස්ථාන 10ක් තෝරාගෙන මෙම අධ්‍යනයන් හා අත්හදා බැලීම් සිදුකර ඇත. 2018 වර්ෂයේ මෙම කාර්යය ආරම්භ කළ නමුත් මෙය අවම වශයෙන් වසර 05ක් වත් අඛණ්ඩ පසුවිපරම් කිරීමක් සහිතව ඉදිරියට පවත්වාගෙන යාම ඉතාමත් අවශ්‍ය බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් යෝජනා කර ඇත.

එම පදනම මත 2018 වර්ෂය මූලික සැලැස්ම සැකසීමේ අදියර (ආරම්භක වසර ) ලෙස සලකා කටයුතු කරනු ලැබූ අතර, 2019 වසරේ සිට ඉදිරියට මෙම සැලැස්මට හා එහි යෝජනා අදාළ පාර්ශවකාර ආයතනවලට හඳුන්වා දෙමින් මෙහි යෝජනා හා නිර්දේශ ක්‍රියාවට නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ.

මේ සඳහා කෑගල්ල, රත්නපුර, කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක 07හි ස්ථාන 10ක් තෝරා ගන්නා ලදී. මෙම වාර්තාවල අන්තර්ගත විෂය කරුණු හා නිර්දේශ සම්බන්ධයෙන් මේ වන විටත් අදාළ පාර්ශවකාර ආයතන දැනුවත් කර ඇති අතර, 2019 වර්ෂයේ සිට මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වඩා පුළුල් මට්ටමින් එම ආයතන සම්බන්ධ කිරීම සිදු කරනු ලැබේ.

2018 වර්ෂයේ වාර්ෂික වැඩ සැලසුම් ඉලක්ක අනුව ඉහත දිස්ත්‍රික්ක 07හි ස්ථාන 10ක් සඳහා රුපියල් මිලියන 0.96ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙකරනු ලැබ ඇත. 2018.12.31 වන විට එහි සමස්ථ මූල්‍ය ප්‍රගතිය 98.38%ක් වූ අතර, භෞතික ප්‍රගතිය 94% කි.

## 5.13. අංකිත දත්ත සහ සිතියම් වෙනත් ආයතන වලට ලබා දීම

ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය මඟින් 2017 වර්ෂයේ යාවත්කාලීන කරන ලද ඉඩම් පරිහරණ දත්ත ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන, ව්‍යාපෘති සහ විශ්ව විද්‍යාල මඟින් නිරන්තරයෙන් ඉල්ලුම් කරනු ලැබේ. මෙම දත්ත අංකිත ලෙස හා භූගෝල විද්‍යාත්මක තොරතුරු පද්ධතියෙහි සිතියම් ලෙස බොහෝ විට ඉල්ලනු ලැබේ. මෙසේ ඉල්ලනු ලබන දත්ත දෙපාර්තමේන්තුව සහ ඉල්ලීම් කරන ආයතනය අතර අත්සන් කරනු ලබන ගිවිසුමකට අනුව නොමිලේ ලබා දෙනු ඇත. 2017- 2018 වර්ෂවලදී ලබා දුන් දත්ත සහ දත්ත ලබාගත් ආයතන පිළිබඳ විස්තර පහත ලේඛනයේ දැක්වේ.

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලීම් කර ඇති අංකිත දත්ත - 2017 – 2018

### වගු අංක 5:13:1

| ආයතනය | අරමුණ | දත්ත ඉල්ලුම් කල ප්‍රදේශය |
|---|---|---|
| **රාජ්‍ය ආයතන** | | |
| විදුලි බල මණ්ඩලය | ජල පෝෂක ප්‍රදේශවල ජල විද්‍යාත්මක අධ්‍යනයන් සඳහා | සීතාවක ගංගා ප්‍රදේශයෙහි පහළ කොටස |
| ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත | සංඛ්‍යාලේඛන පොත සකස් කිරීමට | ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණ දත්ත |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ සහ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා මාස්ටර් සැලසුමක් සෑදීමට | පුත්තලම/ගාල්ල/ගම්පහ/මාතර/කොළඹ/කළුතර දිස්ත්‍රික්ක |
| පොල් සංවර්ධන මණ්ඩලය | පොල් ව්‍යාප්තිය පිළිබඳ හඳුනාගැනීමට | වවුනියාව/මන්නාරම දිස්ත්‍රික්ක |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආපදා කළමනාකරණ දත්ත සඳහා වෙබ් මෘදුකාංගයක් සකස් කිරීමට | ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණ සිතියම |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගංවතුර ආපදා අවම කිරීම සඳහා අධ්‍යනයක් කිරීමට | මඩකලපුව/මොනරාගල/හම්බන්තොට දිස්ත්‍රික්ක |
| මහවැලි අධිකාරිය | වර්තමාන ඉඩම් පරිහරණය හඳුනා ගැනීමට | පදියතලාව සහ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | වී වගාව පිළිබඳ තොරතුරු එකතු කිරීම සඳහා | ශ්‍රී ලංකාවේ වී වගා ව්‍යාප්තිය |
| මහවැලි හා පරිසර අමාත්‍යාංශය | දේශගුණික වෙනස්වීම් සහ එහි බලපෑම අධ්‍යනය | සියළුම දිස්ත්‍රික්කවල දත්ත |
| මහවැලි හා පරිසර අමාත්‍යාංශය | දේශගුණික විපර්යාසවලට ගොදුරු වීමේ අවදානම තක්සේරු කිරීම හා නියාමනය සඳහා | සියළුම දිස්ත්‍රික්කවල දත්ත |
| මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | මධ්‍යම අධිවේගී මාර්ග කලාපයේ සංවර්ධන කටයුතු සඳහා | මධ්‍යම පළාතේ දත්ත |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | වී නිෂ්පාදන අස්වැන්න පුරෝකථනය සඳහා | ශ්‍රී ලංකාවේ වී වගා ව්‍යාප්තිය |
| ප්‍රවාහන අමාත්‍යාංශය | රජරට අවදි කිරීමේ වැඩසටහන | කුරුණෑගල/මාතලේ/අනුරාධපුර/පොළොන්නරුව දිස්ත්‍රික්ක |
| ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | දේශගුණික විපර්යාස කළමනාකරණය කිරීමේ වැඩසටහන | වවුනියාව දිස්ත්‍රික්කය |
| ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | ජල ආරක්ෂණ සැලසුම් සකස් කිරීම් සඳහා | රුවන්වැල්ල /වරකාපොල |
| ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | ග්‍රාමීය ශක්‍යතා අධ්‍යනය | වවුනියාව දිස්ත්‍රික්කය |
| ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය | රබර් ව්‍යාප්ති ප්‍රදේශ හඳුනා ගැනීමට | කළුතර දිස්ත්‍රික්කය |
| ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය | ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යනය | අගනගර 9 සඳහා |
| නාගරික සංවර්ධන අධිකාරිය | 2018-2030 සංවර්ධන සැලැස්ම සකස් කිරීමට | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| නාගරික සංවර්ධන අධිකාරිය | බොරලැස්ගමුව හා හෝමාගම සංවර්ධන සැලැස්ම සකස් කිරීමට | හෝමාගම/කැස්බව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා | දේශගුණික කලාප හා පරිපාලන කොට්ඨාශය |
| **විශ්ව විද්‍යාල** | | |
| මොරටුව විශ්ව විද්‍යාලය | පර්යේෂණ සඳහා | බත්තරමුල්ල |
| සණස කැම්පස් | පර්යේෂණ සඳහා | රත්නපුර/කොළඹ/කෑගල්ල/ගම්පහ දිස්ත්‍රික්ක |
| පශ්චාත් උපාධි විද්‍යායතනය - | ගිංගඟ ව්‍යාපෘතිය සඳහා | ගිංගඟ ප්‍රදේශය |
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය | | |

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීම් කර ඇති අංකිත දත්ත - 2017 – 2018

| | | |
|---|---|---|
| පශ්චාත් උපාධි විද්‍යායතනය - | එල්ලංගා පද්ධතිය පිළිබඳ අධ්‍යයනය | මාතලේ දිස්ත්‍රික්කය |
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය | | |
| කොළඹ විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | රද්දෙගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
| කොළඹ විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| කොළඹ විශ්ව විද්‍යාලය | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු | අනුරාධපුර/පොලොන්නරුව/වවුනියා දිස්ත්‍රික්ක |
| කැලණිය විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | උමාඔය උප ජලධාරා ප්‍රදේශය |
| කැලණිය විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | මැදදුම්බර/තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | දිස්ත්‍රික්ක 6 |
| රුහුණු විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | යාපනය/මුලතිවු/මඩකලපුව/අම්පාර/මාතලේ/බදුල්ල/මොනරාගල/අනුරාධපුර/ |
| සබරගමුව විශ්ව විද්‍යාලය | පර්යේෂණ සඳහා | කොළඹ දිස්ත්‍රික්කය |
| සබරගමුව විශ්ව විද්‍යාලය | පර්යේෂණ සඳහා | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| සබරගමුව විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | ගාල්ල/මාතර දිස්ත්‍රික්ක |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | තිහගොඩ/බුලත්සිංහල/හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | මත්තල ගුවන් තොටුපොල ප්‍රදේශය |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | අධ්‍යයන කටයුතු | හම්බන්තොට දිස්ත්‍රික්කය |
| සබරගමුව විශ්ව විද්‍යාලය | පර්යේෂණ සඳහා | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| **ව්‍යාපෘති** | | |
| ක්රිප් ව්‍යාපෘතිය - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගංවතුර අවදානම් අධ්‍යයනය | සියළුම ගංගා ද්‍රෝණි |
| IUCN ව්‍යාපෘතිය | ජෛව විවිධත්ව අධ්‍යයනය | මෝ්ය 33 |
| IUCN ව්‍යාපෘතිය | ජෛව විවිධත්ව අධ්‍යයනය | බදුල්ල/ගම්පහ/මුලතිවු/මන්නාරම/පොලොන්නරුව දිස්ත්‍රික්ක |
| කෑගල්ල වැවිලි ව්‍යාපෘතිය | ක්ෂේත්‍ර අධ්‍යයනය | බුලත්සිංහල ලේකම් කොට්ඨාශය |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායනය | පර්යේෂණ සඳහා | මුන්දල්/මඩකලපුව/කොග්ගල/හලාවත කලපුව |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායනය | කලපු 5 ක් සඳහා පරිසර දත්ත සංග්‍රහයට | පුත්තලම/මීගමුව/රැකව/කෝකිලායි/පානම කලපුව |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | නාය අවදානම් ප්‍රදේශ අධ්‍යනයට | කෑගල්ල දිස්ත්‍රික්කය |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | නැවත පදිංචි කරවීම සඳහා | කළුතර/රත්නපුර/ගාල්ල/මාතර දිස්ත්‍රික්ක |
| ඉංජිනේරු සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ උපදේශනාත්මක සංසදය | දේශගුණික විපර්යාස දරා ගැනීම දියුණු කිරීමේ ව්‍යාපෘතිය | කොලඹ/කෑගල්ල/ගම්පහ දිස්ත්‍රික්ක |
| ජාන තාක්ෂණ ආයතනය | තිරසර සංවර්ධන කටයුතු සඳහා | බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 |

## 5.14. වෙනත් ව්‍යාපෘති

### (i) පාරිසරික සංරක්ෂණ ජාතික වැඩසටහන (පුනරුදය)

ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍යමය දායකත්වය මත පුනරුදය පාරිසරික සංරක්ෂණ ජාතික වැඩසටහන 2016-2018 වර්ෂ තුළ ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව පස හා ජලය සංරක්ෂණය කිරීමත්, ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහාත් ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර පුනරුදය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුළින් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට බලපොරොත්තුවේ.

- ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම
- පාංශු සංරක්ෂණ ක්‍රම ස්ථාපිත කිරීම
- භූමි හායනය වැළැක්වීම
- භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම
- තිරසාර භූමි භාවිතා ක්‍රම ප්‍රචලිත කිරීම

2018 වර්ෂයේ දිස්ත්‍රික්ක 10ක ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන (පුනරුදය) ක්‍රියාත්මක කරනු ලැබීය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 113 ක භූමිය සංරක්ෂණය, ආරක්ෂා කිරීම හා භූමි පරිහරණය වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 31.3ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණයත් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ තාක්ෂණික මඟ පෙන්වීමත් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය.2018.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 100%ක් පමණ වේ.

මෙම වැඩසටහන මඟින් ජලපෝෂක ප්‍රදේශ, ගං ඉවුරු හා වැව් රක්ෂිත වැනි අත්‍යාවශ්‍යයෙන්ම සංරක්ෂණය කළයුතු ප්‍රදේශත්, පාංශු සංරක්ෂණය කළයුතු හා කෘෂිකාර්මික ගෙවතුවල පස සංරක්ෂණ කටයුතු ඉතාමත් සාර්ථක ක්‍රියාවට නැංවිය.2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළ ඡායාරූප පහත දැක්වේ.

පහත දිස්ත්‍රික්කවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

01. මහනුවර
02. මාතලේ
03. නුවර එළිය
04. රත්නපුර
05. කෑගල්ල
06. බදුල්ල
07. මොණරාගල
08. ගම්පහ
09. මාතර
10. කළුතර

**සංරක්ෂණය සඳහා තෝරාගත් ඌණ පරිහරණ ඉඩම් කිහිපයක් හා ඒවායේ පස සංරක්ෂණය කර ඇති ආකාරය.**

**ඡායාරූප අංක 27,28**

**මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාංශු සංරක්ෂණයට පෙර අවස්ථාව**





**පාංශු සංරක්ෂණ ක්‍රම සකස් කිරීමෙන් අනතුරුව**

**ඡායාරූප අංක 29,30**



**ඡායාරූප අංක 31**

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස සංරක්ෂණය ස්ථාපිත කළ ගෙවත්ත වර්තමාන දර්ශණය



**ඡායාරූප අංක 32**

රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස සංරක්ෂණය කටයුතුවල ප්‍රමිතිය පරීක්ෂා කරන අවස්ථාව





**ඡායාරූප අංක 33,34**

කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පස සංරක්ෂණ කටයුතුවල ප්‍රමිතිය පරීක්ෂා කරන අවස්ථාව

කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පස සංරක්ෂණය කටයුතුවල ප්‍රමිතිය පරීක්ෂා කරන අවස්ථාව




බදුල්ල දිස්ත්‍රික්කයේ - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ -

**ඡායාරූප අංක 35,36** පස සංරක්ෂණ කටයුතු අවසන් කළ දර්ශණ




මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ - පස සංරක්ෂණ කටයුතු අවසන් කළ දර්ශණ

**ඡායාරූප අංක 37,38**




**(11) හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සඳහා භූමි ප්‍රතිස්ථාපන සැලසුම් සැකසීම**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් ලෝක අහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ප්‍රදානයක් මත මධ්‍යම කඳුකරයේ බදුල්ල , මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ

සඳහා සහභාගිත්ව ක්‍රමවේදය අනුගමනය කරමින් හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් නැවත පුනරුත්තාපන කිරීම සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

ඒ අනුව තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක 32 ක් සඳහා සැලසුම් සැකසීමට නියමිතය. ඒ අනුව එම ජල පෝෂක සඳහා සහභාගිත්ව ප්‍රවේශය අනුගමනය කරමින් ඉඩම් පරිහරණ සැලසුම් 32ක් සැකසීමේ වගකීම මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. තවද එම සැලසුම් සැකසීමේ දී ලැබෙන අත්දැකීම් උපයෝගී කරගෙන සහභාගිත්ව ඉඩම් පරිහරණ සැලසුම්කරණය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ වගකීමද මෙම දෙපාර්තමේන්තුවට පවරා ඇත.

ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කය සඳහා කුඩා ජල පෝෂක සැලසුම් 16ක් ද මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා සැලසුම් 8 බැගින් 16ක්ද වශයෙන් මුළු සැලසුම් 32 ක් සැකසීම ආරම්භ කරන ලදී . මේ වන විට ඉහත සැලසුම් 32න් 16ක් අවසන් අවස්ථාවේ පවතින අතර, ඉතිරි 16, 2019 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිතය.
මෙම සැලසුම්කරණයේ මූලික අරමුණ වනුයේ අදාළ කුඩා ජලපෝෂකවල ඇති කෘෂිකාර්මික ඉඩම් තවදුරටත් හායනයට පත්වීම වලක්වාලීම සඳහා අවශ්‍ය උපායමාර්ග මෙම සැලසුම් තුළින් හඳුන්වා දී අදාළ ක්‍රියාත්මක කරන ආයතන මඟින් මෙම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් කෘෂිකාර්මික ඉඩම් තවදුරටත් හායනය වීම වලක්වාලීමය. සැලසුම්කරණයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වන සියළුම කාර්යයන් ගොවීන්ගේ පූර්ණ සහභාගිත්වය ඇතිව සිදුකෙරේ.

**ඡායාරූප අංක 39,40** **මහනුවර දිස්ත්‍රික්කයේ - ගුරුකැලේ රාජමලේ ඇල පෝෂක ප්‍රදේශය - ප්‍රජාව දැනුවත් කිරීමේ අවස්ථාවක්**




**ඡායාරූප අංක 41,42** **මහනුවර දිස්ත්‍රික්කයේ - ගුරුකැලේ රාජමලේ ඇල පෝෂක ප්‍රදේශය - ප්‍රශ්නාවලිය ක්ෂේත්‍රගත කිරීමේ අවස්ථාවක්**




## 5.15 දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලැබූ වෙනත් රාජකාරි

2018 වර්ෂයේ විවිධ ආයතනවල ඉල්ලීම පරිදි ඉඩම් යෝග්‍යතා වාර්තා ලබාදීම දෙපාර්තමේන්තුව මගින් ඉටුකළ සුවිශේෂී කාර්යයකි. විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා භූමියේ යෝග්‍යතාවය සැලකිල්ලට ගනිමින් පහත ක්ෂේත්‍ර යටතේ යෝග්‍යතා වාර්තා 1003 කට ආසන්න ප්‍රමාණයක් දිස්ත්‍රික් කාර්යාල 25 ම ආවරණය වන පරිදි ලබා දී ඇත. මෙහිදී කෘෂි කටයුතු සඳහා වාර්තා 168 ක් ද , සංචාරක කටයුතු සඳහා වාර්තා 40 ක් ද, ධීවර කටයුතු සඳහා වාර්තා 12 ක් ද, යටිතල පහසුකම් සඳහා වාර්තා 355 ක් ද, වනවගා හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා වාර්තා 186 ක් ද, වාණිජ්‍ය කටයුතු සඳහා වාර්තා 173 ක් ද, සත්ව පාලන කටයුතු සඳහා වාර්තා 4 ක් ද, වෙනත් කටයුතු සඳහා වාර්තා 92 ක් ද ලබාදී ඇත. සවිස්තරාත්මක තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 5.15.1

| දිස්ත්‍රික්කය | කාර්යය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂි කාර්මික කටයුතු | සංචාරක කටයුතු | ධීවර කටයුතු | යටිතල පහසුකම් | සත්ව පාලන කටයුතු | වන වගා කටයුතු/ පරිසර සංරක්ෂණ | වාණිජ්‍ය කටයුතු | වෙනත් කටයුතු | එකතුව |
| කොළඹ | 3 | | | 2 | | | 1 | 2 | 8 |
| ගම්පහ | 14 | | 7 | 10 | | 4 | 7 | | 42 |
| කළුතර | 6 | 1 | | 4 | | 1 | 5 | | 17 |
| පුත්තලම | 8 | 3 | 4 | 9 | 1 | 1 | 1 | | 27 |
| කුරුණෑගල | 9 | | | 80 | | 47 | 5 | 10 | 151 |
| බදුල්ල | 4 | 2 | | 16 | | 50 | 29 | 13 | 114 |
| මොණරාගල | 6 | 2 | | 9 | | 14 | 54 | | 85 |
| ගාල්ල | 3 | 2 | | 13 | | 2 | 4 | | 24 |
| මාතර | 4 | 2 | | 13 | | 3 | 4 | | 26 |
| හම්බන්තොට | 4 | 2 | 1 | 14 | | 2 | 7 | | 30 |
| කෑගල්ල | 5 | | | 14 | | 2 | 3 | | 24 |
| රත්නපුර | 17 | | | 14 | | | 4 | | 35 |
| මාතලේ | 6 | 8 | | 15 | 2 | 14 | 23 | | 68 |
| මහනුවර | 13 | | | 40 | | 4 | 2 | | 59 |
| නුවරඑළිය | | | | | | 9 | 1 | | 10 |
| අනුරාධපුර | 3 | 1 | | 5 | | | 5 | 18 | 23 |
| පොළොන්නරුව | 14 | 12 | | 3 | | | 2 | | 25 |
| ත්‍රිකුණාමලය | 6 | | | 19 | | 2 | 3 | | 26 |
| අම්පාර | 8 | 1 | | 10 | | | 4 | 44 | 60 |
| මඩකලපුව | 9 | 4 | | 60 | | 31 | 4 | 5 | 147 |
| යාපනය | | | | 2 | | | | | 2 |
| කිලිනොච්චිය | 1 | | | | | | | | |
| මුලතිව් | | | | | | | | | |
| වවුනියාව | 4 | | | 3 | 1 | | 5 | | |
| මන්නාරම් | | | | | | | | | |
| එකතුව | 168 | 40 | 12 | 355 | 4 | 186 | 173 | 92 | 1003 |

## 5.16. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන්වල සාරාංශ මූල්‍ය ප්‍රගතිය

2018 වර්ෂයට අදාළව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුවෙන් දැක්වෙන අතර, එය ප්‍රස්ථාරිකව ද වැඩිදුරටත් පැහැදිලි කොට ඇත.


වගු අංක 5.16.1

## දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය -2018

| වැඩසටහන | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන) | 2018 වර්ෂය තුළ ( සංශෝධිත) ප්‍රතිපාදන (රු. මිලියන) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|---|
| තිරසර භූමි භාවිතය සඳහා ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම | 4.9 | 4.89 | 4.87 |
| සහභාගිත්ව ප්‍රවේශය තුළින් ක්ෂුද්‍ර ජල පෝෂක වල භූමි පරිහරණය සැලසුම් කිරීම | 2.8 | 2.28 | 2.27 |
| පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම | 8.7 | 8.696 | 8.691 |
| පහතරට තෙත් කළාපීය කුඹුරු ඉඩම් භූමි ශක්‍යතා අනුව වර්ගීකරණය කිරීම | 0.585 | 0.597 | 0.591 |
| සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යයන | 3.75 | 3.63 | 3.56 |
| හායනයට පත් ඉඩම් හඳුනා ගැනීම, වර්ගීකරණය සහ සිතියම් ගත කිරීම | 0.665 | 0.651 | 0.606 |
| තෝරාගත් දිස්ත්‍රික්ක වල හඳුනාගෙන ඇති නාය අවදානම් ප්‍රදේශ ස්ථාවර කිරීම සඳහා සුදුසු ඉඩම් පරිහරණයන් නිර්දේශ කිරීම. | 1.0 | 0.96 | 0.945 |
| තිරසර ඉඩම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම් , වැඩමුළු හා සාකච්ඡා | 1.94 | 0.6 | 0.6 |
| ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම (දිස්ත්‍රික්/ ප්‍රාදේශීය හා ග්‍රාමීය ) | 0.66 | 0.740 | 0.723 |

## දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය -2018 ප්‍රස්ථාර ඇසුරින්

ප්‍රස්ථාර අංක 5.16.1



වගු අංක 5.16.2

## දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල භෞතික ප්‍රගතිය -2018

| වැඩසටහන | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ඉලක්කය | 2018 වර්ෂය තුළ සංශෝධිත භෞතික ඉලක්කය | 2018 12.31 දිනට භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| තිරසර භූමි භාවිතය සඳහා ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම | 200 | 200 | 98.72 |
| සහභාගිත්ව ප්‍රවේශය තුළින් ක්ෂුද්‍ර ජල පෝෂකවල භූමි පරිහරණය සැලසුම් කිරීම | 100 | 99 | 98.70 |
| පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම | 100 | 100 | 99.76 |
| පහතරට තෙත් කලාපීය කුඹුරු ඉඩම් භූමි ශක්‍යතාව අනුව වර්ගීකරණය කිරීම | කොළඹ, කළුතර, ගම්පහ, ගාල්ල, මාතර දිස්ත්‍රික්ක වල | 05 | 96.8 |
| සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යයන | 75 | 72 | 96.92 |
| භායනයට පත් ඉඩම් හඳුනා ගැනීම, වර්ගීකරණය සහ සිතියම් ගත කිරීම | 25 | 25 | 98.28 |
| තෝරාගත් දිස්ත්‍රික්කවල හඳුනාගෙන ඇති නාය අවදානම් ප්‍රදේශ ස්ථාවර කිරීම සඳහා සුදුසු ඉඩම් පරිහරණයන් නිර්දේශ කිරීම. | දිස්ත්‍රික්ක 07ක ප්‍රදේශ 10 | 10 | 94 |
| තිරසර ඉඩම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම් , වැඩමුළු හා සාකච්ඡා | 200 | 200 | 100 |
| ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම (දිස්ත්‍රික්/ ප්‍රාදේශීය හා ග්‍රාමීය ) | කමිටු 330 | 360 | 100 |

## දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල භෞතික ප්‍රගතිය -2018

ප්‍රස්ථාර අංක 5.16.2

